# අමාත්‍ය මණ්ඩල කාර්යාලය

# කාර්යසාධන වාර්තාව

# 2015

ජනරජ ගොඩනැගිල්ල, ශ්‍රීමත් බාරොන් ජයතිලක මාවත, කොළඹ - 01.

www.cabinetoffice.gov.lk

# අමාත්‍ය මණ්ඩල කාර්යාලය



"ජනරජයේ පාලනය මෙහෙයවීම සඳහා විධායකයට සහාය වන විශ්වසනීයතම රාජ්‍ය ආයතනය වීම"

## පෙළ ගැස්ම


**1. හැඳින්වීම**

1.1 දැක්ම

1.2 මෙහෙවර

1.3 අරමුණු

1.4 ක්‍රියාකාරකම්

**2. අමාත්‍ය මණ්ඩල කාර්යාලය හා එහි කාර්යභාරය**

2.1 අමාත්‍ය මණ්ඩල රැස්වීම්වලට අදාළ කර්තව්‍යයන්

2.2 අමාත්‍ය මණ්ඩල අනුකාරක සභාවලට අදාළ කටයුතු

2.3 විවිධ විෂයන් සම්බන්ධයෙන් අධ්‍යයනය කොට නිර්දේශ ඉදිරිපත් කිරීම සඳහා අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරනු ලබන නිලධාරි කමිටුවලට අදාළ කර්තව්‍යයන්

2.4 අතිගරු ජනාධිපතිතුමා හෝ අමාත්‍ය මණ්ඩලය හෝ විසින් පවරනු ලබන විශේෂිත රාජකාරි

2.5 අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කෙරෙන අමාත්‍ය මණ්ඩල සංදේශ හා විවිධ වාර්තා පිළියෙල කිරීම පිළිබඳ මාර්ගෝපදේශ නිකුත් කිරීම

2.6 විශේෂ අවධානය යොමු විය යුතු අමාත්‍ය මණ්ඩල තීරණ ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් පසු විපරම් කටයුතු

2.7 අමාත්‍යාංශ හා අනෙකුත් රාජ්‍ය ආයතන සමඟ සමීප සම්බන්ධීකරණයක් පවත්වාගෙන යාම

**3. අමාත්‍ය මණ්ඩල කාර්යාලයේ විවිධ අංශ හා ඒවාට පැවරී ඇති කාර්යභාරයන්**

3.1 සංදේශ අංශය

3.2 වාර්තා සම්පාදන හා භාෂා පරිවර්තන අංශය

3.3 පරිගණක සේවා අංශය

3.4 ආයතන හා සේවා අංශය

3.5 ගිණුම් අංශය

**4. 2015 වර්ෂය තුළ අමාත්‍ය මණ්ඩල කාර්යාලයේ කාර්යසාධනය**

4.1 අමාත්‍ය මණ්ඩල රැස්වීම් සම්බන්ධයෙන් වූ කර්තව්‍යයන්

4.2 අමාත්‍ය මණ්ඩල අනුකාරක සභාවලට අදාළ කටයුතු

4.3 විවිධ විෂයයන් සම්බන්ධයෙන් අධ්‍යයනය කොට නිර්දේශ ඉදිරිපත් කිරීම සඳහා අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරනු ලබන නිලධාරි කමිටුවලට අදාළ කටයුතු

4.4 උපරිමාධිකරණයන්හි විභාගයට ගැනෙමින් පවතින නඩු කටයුතු සඳහා අවශ්‍ය වන තොරතුරු සහ අමාත්‍ය මණ්ඩල තීරණ නීතිපති දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කිරීම.

4.5 2015 වසර තුළ සිදු කරන ලද විශේෂයෙන් සඳහන් කළ යුතු කාර්යභාරයන්.

## 5. අමාත්‍ය මණ්ඩල කාර්යාලයේ කාර්යභාරයේ විශේෂත්වය

## 6. මානව සම්පත් කළමනාකරණය

6.1 2015-12-31 දිනට සේවක සංඛ්‍යා තොරතුරු

6.2 2015-12-31 දිනට සිටි කාර්ය මණ්ඩලය

6.3 2015 වසර තුළ අමාත්‍ය මණ්ඩල කාර්යාලයේ සේවයට අලුතින් එක් වූ සේවක මහත්ම / මහත්මීන්

6.4 විශ්‍රාම ගැනීම්

6.5 ස්ථාන මාරුවීම්

6.6 පුහුණුව හා සංවර්ධනය

## 7. මූල්‍ය හා ගිණුම් කටයුතු සමාලෝචනය

7.1 ඇස්තමේන්තු

7.2 නිලධාරීන් සඳහා ණය අත්තිකාරම් ලබා දීම

7.3 වාර්ෂික ගිණුම් ඉදිරිපත් කිරීම

7.4 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය පැවැත්වීම

7.5 විගණන විමසුම්

## ඇමුණුම්

| | | |
|---|---|---|
| **ඇමුණුම I (අ)** | **-** | 2015-01-08 දින සිට 2015-08-17 දින දක්වා අමාත්‍ය මණ්ඩල කාර්යාලය වෙත යොමු කරන ලද අමාත්‍ය මණ්ඩල සංදේශ සංඛ්‍යාව |
| **ඇමුණුම I (ආ)** | **-** | 2015-08-17 දිනෙන් පසු 2015-12-31 දක්වා එක් එක් අමාත්‍යාංශ විසින් අමාත්‍ය මණ්ඩල කාර්යාලය වෙත යොමු කරන ලද අමාත්‍ය මණ්ඩල සංදේශ සංඛ්‍යාව |
| **ඇමුණුම II (අ)** | - | 2015-01-08 දිනෙන් පසු 2015-08-17 දින දක්වා ක්‍රියා කළ අමාත්‍ය මණ්ඩලයේ සාමාජිකයින් |
| **ඇමුණුම II (ආ)** | - | 2015-08-17 දිනෙන් පසු ක්‍රියා කරන අමාත්‍ය මණ්ඩලයේ සාමාජිකයින් (2015 වසර අවසානය දක්වා) |
| **ඇමුණුම III** | **-** | විසර්ජන ගිණුම 2015 |
| **ඇමුණුම IV** | - | රජයේ නිලධාරින්ට අත්තිකාරම් 'බී' ගිණුම - සැසඳුම් ප්‍රකාශය 2015 |
| **ඇමුණුම V** | - | අමාත්‍ය මණ්ඩල කාර්යාලයේ 2015 වර්ෂයේ විසර්ජන ගිණුම පිළිබඳ විගණකාධිපති වාර්තාව |

# අමාත්‍ය මණ්ඩල කාර්යාලය
# කාර්යසාධන වාර්තාව - 2015

## 1. හැඳින්වීම

### 1.1 දැක්ම

ජනරජයේ පාලනය මෙහෙයවීම සඳහා විධායකයට සහාය වන වඩාත් විශ්වසනීයතම රාජ්‍ය ආයතනය වීම.

### 1.2 මෙහෙවර

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 42 වන ව්‍යවස්ථාවේ (1) වැනි අනුව්‍යවස්ථාව ප්‍රකාරව අමාත්‍ය මණ්ඩලය වෙත පැවරී ඇති ජනරජයේ ආණ්ඩුවේ පාලනය මෙහෙයවීමට සහ ඒ පිළිබඳ විධානයට අදාළ තීරණ ගැනීමේ ක්‍රියාවලියට අවශ්‍ය සියලුම සහායයන් කාර්යක්ෂම ලෙස ලබා දීම.

### 1.3 අරමුණු

අමාත්‍ය මණ්ඩල සංදේශ මඟින් ඉදිරිපත් කෙරෙන යෝජනා සම්බන්ධයෙනුත්, අමාත්‍ය මණ්ඩලයේ අවධානය යොමු වන වෙනත් වැදගත් කරුණු සම්බන්ධයෙනුත්, ඒවායේ ප්‍රතිපත්තිමය හා නෛතික සංකූලතා පිළිබඳ මනා අවබෝධයෙන් යුතුව ජාතියේ හිත පිණිස යෝග්‍යතම තීරණයන්ට එළඹිය හැකි වනු පිණිස අමාත්‍ය මණ්ඩලයට හා අමාත්‍ය මණ්ඩල අනුකාරක සභාවලට උපරිම අයුරින් අවශ්‍ය සහාය ලබා දීම.

### 1.4 ක්‍රියාකාරකම්

(i) අමාත්‍ය මණ්ඩල සංදේශ සකස් කිරීම පිළිබඳ උපදෙස් වරින් වර අමාත්‍යාංශ වෙත නිකුත් කිරීම හා ඒ සම්බන්ධයෙන් අමාත්‍යාංශ ලේකම්වරුන්ට හා ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ට මඟපෙන්වීම සහ පැහැදිලි කිරීම් ඔවුන් වෙත ලබා දීම.

(ii) ජනරජයේ ආණ්ඩුවේ පාලනය මෙහෙයවීම හා ඒ පාලනය පිළිබඳව විධානය සහ ප්‍රතිපත්ති සම්පාදනය සම්බන්ධයෙන් අමාත්‍ය මණ්ඩලය වෙත පැවරී ඇති කාර්යයන් ඉටු කිරීමේදී අමාත්‍ය මණ්ඩලයටත්, අමාත්‍ය මණ්ඩල අනුකාරක සභාවන්ටත්, අමාත්‍ය මණ්ඩල සංදේශ පිළිබඳව නිරවුල්ව හා අදාළ සියලු කරුණු පිළිබඳ නිසි අවබෝධයෙන් යුතුව තීරණ ගැනීමට පහසු වන පරිදි, එම සංදේශ පිළිබඳව නෛතික හා ප්‍රතිපත්තිමය සංකූලතා ගැඹුරින් අධ්‍යයනය කර අතිගරු ජනාධිපතිතුමා වෙතත්, අමාත්‍ය මණ්ඩලය වෙතත්, අමාත්‍ය මණ්ඩල අනුකාරක සභාවන්ටත් කරුණු ඉදිරිපත් කිරීම.

(iii) අමාත්‍ය මණ්ඩල සංදේශවලට නිරීක්ෂණ ලබාගැනීම සඳහා අදාළ අමාත්‍යවරුන් වෙත යොමු කිරීම.

(iv) අමාත්‍ය මණ්ඩල සංදේශ පරීක්ෂා කිරීමෙන් පසුව අමාත්‍ය මණ්ඩල රැස්වීමේ න්‍යාය පත්‍රයට ඇතුළත් කිරීම.

(v) අමාත්‍ය මණ්ඩලයේ සහ අමාත්‍ය මණ්ඩල අනුකාරක සභා රැස්වීම්වලට අවශ්‍ය සියලු සහාය සේවාවන් සැලසීම.

(vi) අමාත්‍ය මණ්ඩල සංදේශ ඒවාට අදාළ නිරීක්ෂණ සමඟ සලකා බැලීම පිණිස අමාත්‍ය මණ්ඩලය වෙත සහ අමාත්‍ය මණ්ඩල අනුකාරක සභා වෙත ඉදිරිපත් කිරීම.

(vii) සංදේශය ඉදිරිපත් කළ අමාත්‍යාංශය විසින් පමණක් නොව එම සංදේශයේ සඳහන් යෝජනා ක්‍රියාත්මක කිරීමට විවිධ අයුරින් සම්බන්ධ වන ආයතන විසින් ඉටු කළ යුතු කාර්යභාරය පිළිබඳව දැනුම්වත් වීම පහසු වන පරිදි අවශ්‍ය විස්තරද ඇතුළත් කරමින් අමාත්‍ය මණ්ඩල රැස්වීම්වල සහ අමාත්‍ය මණ්ඩල අනුකාරක සභා රැස්වීම්වල තීරණ භාෂාත්‍රයෙන්ම (සිංහල/දෙමළ හා ඉංග්‍රීසි) සකස් කිරීම (එක් වරම සිංහල/දෙමළ භාෂාවන්ට පරිවර්තනය කිරීම පහසු කිරීම සඳහා ඉංග්‍රීසි පිටපත මුලින් සකස් කරනු ලැබේ.) එකී තීරණ ඇතුළත් වාර්තා ගරු අමාත්‍යවරුන් වෙතත්, අදාළ අමාත්‍යාංශ ලේකම්වරුන් හා අදාළ වෙනත් බලධරයන් වෙතත් යොමු කිරීම.

(viii) විශේෂ අවධානය යොමු විය යුතු අමාත්‍ය මණ්ඩල තීරණ ක්‍රියාත්මක කිරීම පිළිබඳව පසු විපරම් කටයුතු කිරීම.

(ix) අමාත්‍ය මණ්ඩල තීරණයන්ට එරෙහිව හෝ වෙනත් අයුරකින් අමාත්‍ය මණ්ඩලය වගඋත්තරකරුවන් ලෙස දක්වමින් පවරා ඇති නීති කෘත්‍යයන් සම්බන්ධයෙන් අධිකරණයට ඉදිරිපත් කිරීම සඳහා අවශ්‍ය තොරතුරු නීතිපතිවරයා වෙත ඉදිරිපත් කිරීම.

(x) අතිගරු ජනාධිපතිතුමාගේ හෝ අමාත්‍ය මණ්ඩලයේ හෝ නියමයන් මත පැවරෙන වෙනත් කවර හෝ කාර්යයන් ඉටු කිරීම.

## 2. අමාත්‍ය මණ්ඩල කාර්යාලය හා එහි කාර්යභාරය

ජනරජයේ ආණ්ඩුවේ පාලනය මෙහෙයවීම හා ඒ පාලනය පිළිබඳ විධානයට අදාළව අමාත්‍ය මණ්ඩලය වෙත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් පැවරී ඇති කර්තව්‍යයන් ඉටු කිරීම සඳහා අවශ්‍ය සහාය සේවාවන් සැපයීම පිණිස අමාත්‍ය මණ්ඩල කාර්යාලය ස්ථාපිත කරනු ලැබ ඇත.

19 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මඟින් සංශෝධිත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 50 (1) ව්‍යවස්ථාව ප්‍රකාරව අතිගරු ජනාධිපතිතුමා විසින් පත් කරනු ලබන අමාත්‍ය මණ්ඩලයේ ලේකම්වරයා අමාත්‍ය මණ්ඩල කාර්යාලයේ ප්‍රධානියා වශයෙන් කටයුතු කරයි.

අතිගරු ජනාධිපතිතුමාගේ විධානයන්ට යටත්ව, අතිගරු ජනාධිපතිතුමා විසින් හෝ අමාත්‍ය මණ්ඩලය විසින් හෝ පවරනු ලබන්නා වූ කර්තව්‍යයන් සහ කාර්යය ඉටු කිරීම සඳහා අමාත්‍ය මණ්ඩලයේ ලේකම්වරයාට සහාය වීම මෙම කාර්යාලයේ වගකීම වේ.

ඒ අනුව, අමාත්‍ය මණ්ඩල කාර්යාලයේ කර්තව්‍යයන් ප්‍රධාන වශයෙන් පහත පරිදි දැක්විය හැකිය:

### 2.1 අමාත්‍ය මණ්ඩල රැස්වීම්වලට අදාළ කර්තව්‍යයන්:

2.1.1 අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීම සඳහා ඒ ඒ අමාත්‍යාංශ විසින් මෙම කාර්යාලය වෙත යොමු කරනු ලබන අමාත්‍ය මණ්ඩල සංදේශ, අමාත්‍ය මණ්ඩල අනුකමිටු වාර්තා, අමාත්‍යාංශ සහ දෙපාර්තමේන්තුවල කාර්යසාධන වාර්තා හා රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩලවල වාර්ෂික වාර්තා හා ගිණුම්, නියමිත මාර්ගෝපදේශයන්ට හා එකී කාර්යය සඳහා අමාත්‍ය මණ්ඩල කාර්යාලය විසින් නිකුත් කරනු ලැබ ඇති උපදෙස්වලට අනුකූලව ඉදිරිපත් කර තිබේදැයි පරීක්ෂා කර බලා, එම ලේඛන මෙම කාර්යාලය විසින් භාර ගනු ලැබේ.

2.1.2 මෙසේ භාර ගනු ලබන සෑම අමාත්‍ය මණ්ඩල සංදේශයකටම අනන්‍ය වූ අංකයක් ලබා දෙන අතර, එක් එක් සංදේශය සඳහා ලබා දෙන එම අංකය යටතේ එම සංදේශ අමාත්‍ය මණ්ඩල කාර්යාලයේ ලියාපදිංචි කරනු ලැබේ. එසේ ලියාපදිංචි කරනු ලැබූ අමාත්‍ය මණ්ඩල සංදේශ අදාළ වන පරිදි, නිරීක්ෂණ ලබාගැනීම සඳහා ගරු අමාත්‍යවරුන් වෙත යොමු කෙරේ.

2.1.3 සාමාන්‍යයෙන්, එළඹෙන සතියේ පැවැත්වීමට නියමිත අමාත්‍ය මණ්ඩල රැස්වීමේ න්‍යාය පත්‍රය සතියේ බදාදා වන විට සකස් කර අවසන් කරනු ලබන අතර, එම න්‍යාය පත්‍රය, එයට ඇතුළත් අමාත්‍ය මණ්ඩල සංදේශ ගොනුව හා කලින් සතියේ පැවැත්වුණු

අමාත්‍ය මණ්ඩල රැස්වීමේ කෙටුම්පත් වාර්තාව සමඟ සිකුරාදා හෝ ඊට පෙර ගරු අමාත්‍යවරුන් වෙත ගෙන ගොස් භාර දෙනු ලැබේ.

2.1.4 එළඹෙන සතියට නියමිත අමාත්‍ය මණ්ඩල සංදේශ ගරු අමාත්‍යවරුන් වෙත භාර දීමෙන් අනතුරුව, අමාත්‍ය මණ්ඩල රැස්වීම පැවැත්වීමට නියමිත දිනය දක්වා ඒ ඒ අමාත්‍යාංශ විසින් අමාත්‍ය මණ්ඩල කාර්යාලය වෙත ඉදිරිපත් කරනු ලබන අමාත්‍ය මණ්ඩල සංදේශ අතුරින්, සුවිශේෂී තත්ත්වයන් යටතේ, අමාත්‍ය මණ්ඩලය විසින් නොපමාව සලකා බැලිය යුතු යයි සලකනු ලබන අමාත්‍ය මණ්ඩල සංදේශ ඇතුළත් කර අතිගරු ජනාධිපතිතුමාගේ උපදෙස් අනුව පරිපූරක න්‍යාය පත්‍රයක් සකස් කොට එය අමාත්‍ය මණ්ඩලයේ සලකා බැලීම පිණිස අමාත්‍ය මණ්ඩල රැස්වීම පැවැත්වෙන අවස්ථාවේදී ඉදිරිපත් කරනු ලැබේ.

2.1.5 එසේම විෂය භාර ගරු අමාත්‍යවරුන් විසින් අතිගරු ජනාධිපතිතුමාගේ අනුමැතියට යටත්ව, විශේෂිත හා හදිසි කරුණු යටතේ වන අමාත්‍ය මණ්ඩල සංදේශ අමාත්‍ය මණ්ඩල රැස්වීම පැවැත්වෙන අවස්ථාවේදී අමාත්‍ය මණ්ඩලයේ සලකා බැලීම සඳහා සභාගත කරනු ලැබේ.

2.1.6 එසේ ඉදිරිපත් කරනු ලබන සියලුම අමාත්‍ය මණ්ඩල සංදේශ පිළිබඳව නිරවුල්ව හා අදාළ සියලු කරුණු පිළිබඳ නිසි අවබෝධයකින් යුතුව තීරණ ගැනීම පහසු වන පරිදි, එම සංදේශ පිළිබඳව නෛතික හා ප්‍රතිපත්තිමය සංකූලතා ගැඹුරින් අධ්‍යයනය කර අමාත්‍ය මණ්ඩලයටත්, අමාත්‍ය මණ්ඩල අනුකාරක සභාවන්ටත් කරුණු ඉදිරිපත් කිරීම අමාත්‍ය මණ්ඩල ලේකම්වරයා විසින් සිදු කරන අතර ඒ සඳහා සහාය වීම මෙම කාර්යාලයෙන් ඉටු වන එක් වැදගත් කර්තව්‍යයකි.

2.1.7 අමාත්‍ය මණ්ඩල රැස්වීම පැවැත්වීමෙන් අනතුරුව, රටේ ජනතාව විසින් දැනගත යුතු වැදගත් අමාත්‍ය මණ්ඩල තීරණ ඇතුළත් වාර්තාවක් එදිනම සකස් කොට එය ජනමාධ්‍ය වෙත නිකුත් කිරීම සඳහා අමාත්‍ය මණ්ඩලයේ සම-ප්‍රකාශකවරුන් වශයෙන් කටයුතු කරනු ලබන ගරු අමාත්‍යතුමන්ලා වෙත වහාම යොමු කෙරේ. (කෙසේ වුවද, ඊළඟ සතියේ පැවැත්වෙන අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී සම්මත කිරීමෙන් අනතුරුව පමණක් ක්‍රියාත්මක කළ යුතුව ඇති ඇතැම් අමාත්‍ය මණ්ඩල තීරණ සහ එම රැස්වීමේදී සංශෝධනය වීමට ඉඩ ඇතැයි සිතිය හැකි තීරණද එම වාර්තාවට ඇතුළත් නොකෙරේ).

2.1.8 ඒ ඒ අමාත්‍යාංශ විසින් ඉදිරිපත් කරනු ලබන සංදේශ පිළිබඳව අමාත්‍ය මණ්ඩලය විසින් එළඹෙන තීරණ අතුරින් වහා කටයුතු කළ යුතු යැයි අදහස් කරනු ලබන විෂයන්ට අදාළ කෙටුම්පත් තීරණ එදිනම ඉතා ඉක්මනින් ෆැක්ස් මඟින් අදාළ අමාත්‍යාංශ වෙත යවනු ලැබේ.

2.1.9 අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී ගනු ලැබූ තීරණ ඇතුළත් කොට අමාත්‍ය මණ්ඩල රැස්වීමේ වාර්තාව සකස් කිරීමේ කටයුතු අමාත්‍ය මණ්ඩල රැස්වීම අවසන් වූ වහාම ආරම්භ කෙරෙන අතර, එය භාෂාත්‍රයෙන්ම සකස් කර (දෙමළ පරිවර්තනය සකස් කිරීම ප්‍රමාද වීම වැළැක්වීම සඳහා මුලින්ම ඉංග්‍රීසි පිටපත සකස් කරනු ලැබේ.) ඊළඟ සතියේ අමාත්‍ය මණ්ඩල රැස්වීමේ න්‍යාය පත්‍රය හා එයට ඇතුළත් අමාත්‍ය මණ්ඩල සංදේශ ගොනුව සමඟ එළැඹෙන සිකුරාදා හෝ ඊට පෙර ලැබෙන සේ ගරු අමාත්‍යවරුන් වෙත ගෙන ගොස් භාර දෙනු ලැබේ.

2.1.10 මීළඟට පැවැත්වෙන රැස්වීමේදී අමාත්‍ය මණ්ඩලය විසින් සම්මත කිරීමෙන් අනතුරුව කලින් සතියේ පැවැත්වුණු අමාත්‍ය මණ්ඩල රැස්වීමේ තීරණ අමාත්‍ය මණ්ඩල කාර්යාලය විසින් භාෂාත්‍රයෙන්ම සකස් කර, එකී තීරණ ක්‍රියාත්මක කිරීමේ වගකීම පැවරෙන අදාළ අමාත්‍යාංශ සහ වෙනත් රාජ්‍ය ආයතන වෙත යවනු ලැබේ.

## 2.2 අමාත්‍ය මණ්ඩල අනුකාරක සභාවලට අදාළ කටයුතු:

එක් එක් විෂය ක්ෂේත්‍රය සම්බන්ධයෙන් ගරු අමාත්‍යවරුන් විසින් සාමාන්‍යයෙන් තනි තනිව හෝ ඇතැම්විට ඒකාබද්ධව සංදේශ ලෙස ඉදිරිපත් කරනු ලබන යෝජනා පිළිබඳව, ප්‍රථම කොට, අවශ්‍ය පරිදි, ජ්‍යෙෂ්ඨ රාජ්‍ය නිලධරයන්ගේද සහාය ඇතිව, ගැඹුරින් අධ්‍යයනය කොට, අමාත්‍ය මණ්ඩලය වෙත නිර්දේශ ඉදිරිපත් කිරීමට හැකි වනු පිණිස ඒ ඒ විෂයට අදාළ වන පරිදි ගරු අමාත්‍යවරුන්ගෙන් සමන්විත අමාත්‍ය මණ්ඩල අනුකාරක සභා අමාත්‍ය මණ්ඩල තීරණ මඟින් පිහිටුවා ඇත. එකී අනුකාරක සභාවන්හි කටයුතු සම්බන්ධීකරණය කිරීමත්, විශේෂයෙන්ම ආයතන කටයුතු පිළිබඳ අමාත්‍ය මණ්ඩල අනුකාරක සභාවට අදාළ කටයුතු සිදු කිරීමත් අමාත්‍ය මණ්ඩල කාර්යාලයේ මූලිකත්වයෙන් සිදු කෙරිණි.

## 2.3 විවිධ විෂයයන් සම්බන්ධයෙන් අධ්‍යයනය කොට නිර්දේශ ඉදිරිපත් කිරීම සඳහා අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරනු ලබන නිලධාරි කමිටුවලට අදාළ කර්තව්‍යයන්:

අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කෙරෙන අමාත්‍ය මණ්ඩල සංදේශවලට අදාළ කරුණු පිළිබඳව වැඩිදුරටත් අධ්‍යයනය කොට නිර්දේශ ඉදිරිපත් කිරීම සඳහා පත් කරනු ලබන නිලධාරි කමිටු සමඟ සම්බන්ධීකරණය කොට අදාළ වාර්තා නියමිත දිනට ලබාගැනීමෙන් අනතුරුව, අමාත්‍ය මණ්ඩලයේ සලකා බැලීම සඳහා අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීම අමාත්‍ය මණ්ඩල කාර්යාලය වෙත පැවරී ඇති වගකීමකි.

**2.4 අතිගරු ජනාධිපතිතුමා හෝ අමාත්‍ය මණ්ඩලය හෝ විසින් පවරනු ලබන විශේෂිත රාජකාරි:**

අතිගරු ජනාධිපතිතුමා විසින් සහ අමාත්‍ය මණ්ඩලය විසින් අමාත්‍ය මණ්ඩලයේ ලේකම්වරයා වෙත කලින් කලට පවරනු ලබන විශේෂ රාජකාරිවලට අදාළ කර්තව්‍යයන් සහ වගකීම් කඩිනමින් ඉටු කිරීම සඳහා අවශ්‍ය සහාය අමාත්‍ය මණ්ඩල ලේකම්වරයා වෙත ලබා දීමද අමාත්‍ය මණ්ඩල කාර්යාලයේ කර්තව්‍යයකි.

**2.5 අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කෙරෙන අමාත්‍ය මණ්ඩල සංදේශ හා විවිධ වාර්තා පිළියෙල කිරීම සම්බන්ධයෙන් මාර්ගෝපදේශ නිකුත් කිරීම:**

අමාත්‍ය මණ්ඩල සංදේශ පිළියෙල කිරීම හා එම සංදේශ අමාත්‍ය මණ්ඩලය කාර්යාලය වෙත ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් අදාළ වන මාර්ගෝපදේශ හා උපදෙස් කලින් කලට නිකුත් කිරීම අමාත්‍ය මණ්ඩල කාර්යාලයේ වගකීමක් වේ.

**2.6 විශේෂ අවධානය යොමු විය යුතු අමාත්‍ය මණ්ඩල තීරණ ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් පසු විපරම් කටයුතු:**

අමාත්‍යාංශ විසින් ඉදිරිපත් කරනු ලබන අමාත්‍ය මණ්ඩල සංදේශ පදනම් කරගෙන අමාත්‍ය මණ්ඩලය විසින් ගනු ලබන තීරණ අතුරින් සුවිශේෂ වැදගත්කමකින් යුත් තීරණ ඒ ආකාරයෙන්ම නියමිත කාලවකවානු තුළදී ක්‍රියාත්මක වන බව තහවුරු කරගැනීමේ අරමුණින් හා එම තීරණ ක්‍රියාත්මක කිරීමේදී පැන නැගෙන ගැටලු කිසිවක් වෙතොත් ඒ සම්බන්ධයෙන් අමාත්‍ය මණ්ඩලයේ අවධානය යොමු කිරීමේ අරමුණින් අමාත්‍ය මණ්ඩල කාර්යාලය විසින් එකී තීරණ ක්‍රියාත්මක කිරීම පිළිබඳව පසු විපරම් කටයුතු කරනු ලබයි.

**2.7 අමාත්‍යාංශ හා අනෙකුත් රාජ්‍ය ආයතන සමඟ සමීප සම්බන්ධීකරණයක් පවත්වාගෙන යාම:**

අමාත්‍ය මණ්ඩලයේ කාර්යයන්ට අදාළ කරුණු සම්බන්ධයෙන් ජනාධිපති ලේකම් කාර්යාලය, මුදල් අමාත්‍යාංශය සහ අනෙකුත් සියලුම අමාත්‍යාංශ, රජයේ අනෙකුත් ආයතන සමඟ මෙන්ම රාජ්‍ය සේවා කොමිෂන් සභාව, එවකට ජාතික වැටුප් කොමිෂන් සභාව සහ නීතිපති දෙපාර්තමේන්තුව වැනි ආයතන සමඟද සමීප සම්බන්ධීකරණයක් පවත්වාගෙන යාම අමාත්‍ය මණ්ඩල කාර්යාලය විසින් කරනු ලබයි.

## 3. අමාත්‍ය මණ්ඩල කාර්යාලයේ විවිධ අංශ හා ඒවාට පැවරී ඇති කාර්යභාරයන්:

අමාත්‍ය මණ්ඩල කාර්යාලයේ කටයුතු පහසුවෙන් ඉටු කරගැනීම සඳහා කාර්යාලය තුළ පහත සඳහන් පරිදි අංශ කිහිපයක් ස්ථාපිත කර ඇති අතර, එකී අංශවලට අදාළ රාජකාරි පවරා වඩා ඵලදායී හා කාර්යක්ෂම ලෙස ඉටු කරගැනීම පිණිස පියවර ගෙන ඇත.

### 3.1 සංදේශ අංශය:

පහත සඳහන් කර්තව්‍යයන් මෙම අංශය වෙත පැවරී ඇත:

(i) විවිධ අමාත්‍යාංශ වෙතින් ලැබෙන අමාත්‍ය මණ්ඩල සංදේශ පිළිබඳව මූලික පරීක්ෂාවකින් අනතුරුව එක් එක් අමාත්‍යාංශ වෙත වෙන් කර දී ඇති අංක යටතේ ලියාපදිංචි කිරීම.

(ii) ලියාපදිංචි කෙරුණු අමාත්‍ය මණ්ඩල සංදේශ/සටහන් පිළිබඳ මූලික අධ්‍යයනයකින් පසුව හා න්‍යාය පත්‍රයට ඇතුළත් කර ඉදිරිපත් කිරීමට පෙර, එම සංදේශවල සඳහන් යෝජනා සෘජුවම අදාළ වන අමාත්‍යාංශවල ගරු අමාත්‍යවරුන්ගේ නිරීක්ෂණ ලබාගැනීම සඳහා යොමු කිරීම.

(iii) අමාත්‍ය මණ්ඩලයේ ලේකම්වරයාගේ උපදෙස් හා මඟපෙන්වීම මත අමාත්‍ය මණ්ඩල රැස්වීම් හා අනුකාරක සභා රැස්වීම් සඳහා වන න්‍යාය පත්‍ර සහ පරිපූරක න්‍යාය පත්‍ර පිළියෙල කිරීම.

(iv) ගරු අමාත්‍යවරුන්ගේ පහසු විමර්ශනය සඳහා, භාෂාත්‍රයෙන් පිළියෙල කරනු ලබන පෙර රැස්වීමෙහි කෙටුම්පත් තීරණ ඇතුළත් වාර්තාව, මීළඟ අමාත්‍ය මණ්ඩල රැස්වීමේ න්‍යාය පත්‍රයට ඇතුළත් කර ඇති අමාත්‍ය මණ්ඩල සංදේශ සහ න්‍යාය පත්‍රයේ එක් එක් පිටපත බැගින් අන්තර්ගත වන ගොනු සකස් කිරීම.

(v) ඉහත පරිදි සකසන ලද න්‍යාය පත්‍රය හා අදාළ සංදේශද පසුගිය රැස්වීමේ කෙටුම්පත් වාර්තාව ද අතිගරු ජනාධිපතිතුමා, ගරු අග්‍රාමාත්‍යතුමා සහ අමාත්‍ය මණ්ඩලයේ සාමාජිකයින් වන ගරු අමාත්‍යවරුන් වෙත ගෙන ගොස් භාර දීම.

(vi) අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරනු ලබන දෙපාර්තමේන්තු ප්‍රධානීන් පත් කිරීම පිළිබඳ පත් කිරීම් ලිපි නිකුත් කිරීමට ලේකම්වරයාට සහාය වීම.

(vii) සම්මත කරනු ලැබූ අමාත්‍ය මණ්ඩල තීරණ අදාළ අමාත්‍යාංශවල ලේකම්වරුන් වෙත හා අනෙකුත් බලධාරීන් වෙත ගෙනගොස් භාරදීම.

## 3.2 වාර්තා සම්පාදන හා භාෂා පරිවර්තන අංශය:

අමාත්‍ය මණ්ඩල කාර්යාලයේ අවසන් නිමැවුම ලෙස සැලකිය හැකි අමාත්‍ය මණ්ඩල රැස්වීම්වලදී ගනු ලැබූ තීරණ අන්තර්ගත අමාත්‍ය මණ්ඩල රැස්වීමේ වාර්තාව භාෂාත්‍රයෙන් සැකසීම සඳහා මෙම අංශයේ දායකත්වය ලබා ගැනේ. එකී කාර්යය ඉටු කිරීමේදී මෙම අංශයේ නිලධාරීන් අමාත්‍ය මණ්ඩලයේ ලේකම්වරයාගේ සහ අමාත්‍ය මණ්ඩල කාර්යාලයේ අතිරේක ලේකම්වරුන්ගේ සෘජු හා සමීප අධීක්ෂණය යටතේ කටයුතු කරනු ලබයි.

## 3.3 පරිගණක සේවා අංශය:

මෙම අංශය විසින් පහත කර්තව්‍යයන් ඉටු කරනු ලබයි:

(i) අමාත්‍ය මණ්ඩල රැස්වීම් වාර්තා, අමාත්‍ය මණ්ඩල අනුකාරක සභා රැස්වීම් වාර්තා හා අමාත්‍ය මණ්ඩලය හා අමාත්‍ය මණ්ඩල අනුකාරක සභා වෙත ඉදිරිපත් කරනු ලබන වෙනත් වාර්තා හා ලියකියවිලි භාෂාත්‍රයෙන් පරිගණකගත කිරීම.

(ii) මහජනතාව විසින් දැනගත යුතු වැදගත් අමාත්‍ය මණ්ඩල තීරණ හා වෙනත් අදාළ තොරතුරු අමාත්‍ය මණ්ඩල කාර්යාලයේ නිල වෙබ් අඩවියේ පළ කිරීම.

(iii) පසුගිය අමාත්‍ය මණ්ඩල තීරණ පිළිබඳ සාරාංශ හා දත්ත ඇතුළත් ගොනු අභ්‍යන්තර භාවිතය සඳහා මෘදු පිටපත් ලෙස පවත්වා ගැනීම.

## 3.4 ආයතන හා සේවා අංශය:

කාර්යාලයේ කටයුතු කාර්යක්ෂමව හා විධිමත්ව පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය සියලු සහාය සේවාවන් හා පහසුකම් සලසන ඒකකය වශයෙන් ආයතන හා සේවා අංශය කටයුතු කරනු ලබයි.

මෙම අංශය වෙත පහත සඳහන් කර්තව්‍යයන් පැවරී ඇත:

(i) දෛනික තැපැලට අදාළ රාජකාරි කටයුතු.
(ii) කාර්යාලයේ නඩත්තු හා මෙහෙයුම් කටයුතු.
(iii) අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා අනෙකුත් ආයතන වෙත ලිපි බෙදා හැරීම.
(iv) කාර්ය මණ්ඩලයේ නිලධාරීන්ගේ පෞද්ගලික ලිපිගොනු සම්බන්ධ කටයුතුද ඇතුළත් සියලු ආයතනික හා පාලන කටයුතු.
(v) කාර්යාලය සඳහා භාණ්ඩ හා සේවා සැපයීම සම්බන්ධයෙන් වන ප්‍රසම්පාදන කටයුතු.

(vi) ප්‍රවාහන පහසුකම් (පණිවුඩ යැවීම) සහ සුබසාධන සේවාවන් ලබා දීම.

(vii) පුහුණුව සඳහා නිලධාරීන් යොමු කිරීම.

**3.5 ගිණුම් අංශය:**

මෙම අංශය වෙත පහත කර්තව්‍යයන් පැවරී ඇත:

(i) කාර්යාලයේ සියලුම ගිණුම් කටයුතු මෙහෙයවීම හා ගිණුම් වාර්තා කිරීම.

(ii) කාර්යාලය සඳහා අවශ්‍ය අක්මුදල් ලබාගැනීම හා බැංකු ගිණුම් පවත්වාගෙන යාම.

(iii) මහා භාණ්ඩාගාරය විසින් ඉල්ලා සිටින වාර්තා ඉදිරිපත් කිරීම.

(iv) කාර්ය මණ්ඩලයට වැටුප් හා දීමනා ගෙවීම් සහ ඊට අදාළ ආනුෂංගික කටයුතු.

(v) අයවැය ඇස්තමේන්තු සකස් කිරීමට ලේකම්වරයාට සහාය වීම.

(vi) පාරිභෝජ්‍ය හා මූලධන වත්කම් ප්‍රසම්පාදනයට අදාළ කරුණු.

(vii) විගණන විමසුම්වලට අදාළ මූලික තොරතුරු ලේකම්වරයා වෙත ඉදිරිපත් කිරීම.

## 4. 2015 වර්ෂය තුළ අමාත්‍ය මණ්ඩල කාර්යාලයේ කාර්යසාධනය:

### 4.1 අමාත්‍ය මණ්ඩල රැස්වීම් සම්බන්ධයෙන් වූ කර්තව්‍යයන්:

4.1.1 2015 වර්ෂය තුළ පත් වූ රජයයන් දෙකක් යටතේ අමාත්‍ය මණ්ඩලයේ විශේෂ රැස්වීම් 05ක් ද ඇතුළුව අමාත්‍ය මණ්ඩල රැස්වීම් 44 ක් පවත්වන ලදී. ඉන් රැස්වීම් 28 ක් 2015 ජනවාරි මස 08 දින පවත්වන ලද ජනාධිපතිවරණයෙන් පසු පත් වූ රජය යටතේද, රැස්වීම් 16ක් 2015 අගෝස්තු මස 17 දින පවත්වන ලද පාර්ලිමේන්තු මහ මැතිවරණයෙන් අනතුරුව පත් වූ නව රජය යටතේ ද පැවැත්විණි. අමාත්‍ය මණ්ඩලයේ තීරණ අපේක්ෂාවෙන් විවිධ අමාත්‍යාංශවලින් අමාත්‍ය මණ්ඩල සංදේශ 2,038 ක් 2015 වසර තුළ ඉදිරිපත් කරනු ලැබිණි. (2015-01-08 දින සිට 2015-08-17 දින දක්වා ක්‍රියාත්මක වූ අමාත්‍යාංශ සහ 2015 සැප්තැම්බර් මස සිට ක්‍රියාත්මක වූ අමාත්‍යාංශ යටතේ එක් එක් අමාත්‍යාංශය විසින් 2015 වර්ෂයේදී අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල සංදේශ සංඛ්‍යාව I (අ) සහ I (ආ)ඇමුණුම් හි දැක්වේ.) 2015 වසර තුළ පත් වූ රජයන් දෙක යටතේ අමාත්‍ය මණ්ඩලයේ සාමාජිකයන් ලෙස කටයුතු කරන ලද ඇමතිවරුන්ගේ නාමලේඛන II (අ) සහ II (ආ) ඇමුණුම්හි දැක්වේ.

4.1.2 මෙකී සංදේශ සම්බන්ධයෙන් අදාළ අමාත්‍යාංශ වෙතින් නිරීක්ෂණ ලබාගැනීමට කටයුතු කරන ලද අතර, අවශ්‍ය අවස්ථාවන්හිදී අමාත්‍ය මණ්ඩලය වෙත කරුණු ඉදිරිපත් කිරීම සඳහා අමාත්‍ය මණ්ඩලයේ ලේකම්වරයා හා ජ්‍යෙෂ්ඨ නිලධාරීන් විසින් එම සංදේශ පිළිබඳ නෛතික හා ප්‍රතිපත්තිමය පසුබිම හා එම යෝජනාවලින් පැන නඟින සංකූලතා ආදිය ගැන ගැඹුරින් අධ්‍යයනය කරන ලදී.

4.1.3 අමාත්‍ය මණ්ඩලය විසින් සාකච්ඡාවට ගනු ලැබූ අමාත්‍ය මණ්ඩල සංදේශවලට අදාළව එළඹි තීරණ ඇතුළත් වාර්තා මෙම කාර්යාලය විසින් භාෂාත්‍රයෙන්ම සකස් කර ගරු අමාත්‍යවරුන් වෙතත්, අදාළ තීරණ ක්‍රියාත්මක කිරීමේ වගකීම පැවරී තිබූ අමාත්‍යාංශ ලේකම්වරුන් වෙත හා අනෙකුත් අදාළ ආයතන වෙතත් යොමු කරන ලදී.

*වගුව 1 : 2015 වර්ෂය තුළ ඒ ඒ අමාත්‍ය මණ්ඩල සංදේශ ඉදිරිපත් කරන ලද කාර්යය අනුව සකසන ලද වර්ගීකරණයක සාරාංශය:*

| කාණ්ඩය | සංදේශ ගණන |
|---|---|
| ප්‍රතිපත්තිමය කටයුතු | 1,120 |
| ව්‍යවස්ථා සම්පාදනයට අදාළ කටයුතු | 80 |
| ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විධිවිධාන පරිදි අමාත්‍ය මණ්ඩලය විසින් ඉටු කළ යුතු ආයතනික කටයුතු | 601 |
| ප්‍රසම්පාදන කටයුතු | 116 |
| වාර්ෂික වාර්තා | 121 |
| **එකතුව** | **2,038** |

2015 අගෝස්තු 17 දින පැවැති පාර්ලිමේන්තු මහ මැතිවරණයට පෙර අවසන් වරට අමාත්‍ය මණ්ඩල රැස්වීමක් පවත්වන ලද 2015 අගෝස්තු 05 දිනට පසු ලැබුණු අමාත්‍ය මණ්ඩල සංදේශ අභිනව අමාත්‍ය මණ්ඩලයේ අදාළ අමාත්‍යවරයාගේ අභිමතය පරිදි නැවත ඉදිරිපත් කිරීමට හෝ ඊට සුදුසු තීරණයක් ගැනීමට හැකි වන පරිදි අදාළ අමාත්‍යාංශ වෙත ආපසු යවන ලදී.

## 4.2 අමාත්‍ය මණ්ඩල අනුකාරක සභාවලට අදාළ කටයුතු:

අමාත්‍ය මණ්ඩලයේ තීරණ ගැනීමේ ක්‍රියාවලිය පහසු කරලීම පිණිස නිශ්චිත ක්ෂේත්‍ර හෝ කරුණු සම්බන්ධයෙන් සුදුසු නිර්දේශ ඉදිරිපත් කිරීම පිණිස පහත සඳහන් අමාත්‍ය මණ්ඩල අනුකාරක සභා අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන ලදී:

(අ) ජාතික ප්‍රතිපත්තිය පිළිබඳ අමාත්‍ය මණ්ඩල අනුකාරක සභාව

(ආ) ආර්ථික කටයුතු පිළිබඳ අමාත්‍ය මණ්ඩල අනුකාරක සභාව

(ඇ) ආයතන කටයුතු පිළිබඳ අමාත්‍ය මණ්ඩල අනුකාරක සභාව

(ඈ) ව්‍යවස්ථා කටයුතු පිළිබඳ අමාත්‍ය මණ්ඩල අනුකාරක සභාව

(ඉ) ප්‍රසම්පාදන කටයුතු පිළිබඳ අමාත්‍ය මණ්ඩල අනුකාරක සභාව

(ඊ) ජීවන වියදම් පිළිබඳ අමාත්‍ය මණ්ඩල අනුකාරක සභාව

(උ) අධ්‍යාපනය පිළිබඳ අමාත්‍ය මණ්ඩල අනුකාරක සභාව

**(අ) ජාතික ප්‍රතිපත්තිය පිළිබඳ අමාත්‍ය මණ්ඩල අනුකාරක සභාව:**

මෙම අනුකාරක සභාව වෙත පහත සඳහන් කාර්යභාරය පැවරී තිබිණි.

(i) රජයේ ජාතික ප්‍රතිපත්තියට අදාළ කරුණු පිළිබඳව අමාත්‍ය මණ්ඩලය වෙත උපදෙස් ලබා දීම;

(ii) අමාත්‍ය මණ්ඩල සංදේශවල ඉදිරිපත් කර ඇති යෝජනා, ඉදිරිපත් කෙරෙන ජාතික ප්‍රතිපත්තියට අනුකූල බව සහ රජයේ සංවර්ධන වැඩසටහනේ හඳුනාගත් ප්‍රමුඛතාවන්ට අනුව බව තහවුරු කර ගැනීම; සහ;

(iii) පළාත් සභා විසින් සිය බලතල ක්‍රියාත්මක කිරීමේදී ජාතික ප්‍රතිපත්තියට අනුකූලව කටයුතු කරන බව තහවුරු කරනු පිණිස සම්බන්ධීකරණ ක්‍රමවේදයක් සකස් කිරීම.

මෙම අනුකාරක සභාවේ සංයුතිය පහත පරිදි විය:

* අතිගරු ජනාධිපතිතුමා - (සභාපති);
* අග්‍රාමාත්‍යතුමා;
* විදේශ කටයුතු අමාත්‍යතුමා;
* මුදල් අමාත්‍යතුමා;
* විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමා;
* සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමා;
* මහාමාර්ග, උසස් අධ්‍යාපන හා ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යතුමා; සහ
* අධිකරණ හා කම්කරු සබඳතා අමාත්‍යතුමා.

ඒ ඒ අමාත්‍යවරයාගේ විෂයපථය යටතට ගැනෙන කාර්යයන් සම්බන්ධයෙන් සාකච්ඡා කරනු ලබන අවස්ථාවේදී, ඒ සඳහා සහභාගි වන ලෙස අදාළ විෂය භාර අමාත්‍යවරයාට/ අමාත්‍යවරියට අනුකාරක සභාව විසින් ආරාධනා කළ හැකිය.

මෙම අනුකාරක සභාව සඳහා සහාය වීම පිණිස පහත සඳහන් අකාරයට ජ්‍යෙෂ්ඨ නිලධාරින් පිරිසක් හඳුනාගැනීමට ද තීරණය කරන ලදී.

අමාත්‍ය මණ්ඩල අනුකාරක සභාව විසින්, ඊට සහාය වීම පිණිස, අතිගරු ජනාධිපතිතුමාගේ ජ්‍යෙෂ්ඨ උපදේශකවරුන්ගෙන්, ගරු අග්‍රාමාත්‍යතුමාගේ ජ්‍යෙෂ්ඨ උපදේශකවරුන්ගෙන් සහ අමාත්‍යාංශ ලේකම්වරුන් අතුරෙන් නිලධාරි කණ්ඩායමක් හඳුනාගනු ඇත. ප්‍රතිපත්ති සම්පාදන, ආර්ථික කටයුතු, ළමා, තරුණ හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයේ ලේකම්වරයා හෝ ඔහු විසින් නම් කරනු ලබන අතිරේක ලේකම්වරයකු මෙම අනුකාරක සභාවේ ලේකම්/කැඳවුම්කරු ලෙස කටයුතු කරනු ඇත.

## (ආ) ආර්ථික කටයුතු පිළිබඳ අමාත්‍ය මණ්ඩල අනුකාරක සභාව:

2015-09-22 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය මඟින් **ආර්ථික කළමනාකරණය පිළිබඳ අමාත්‍ය කාරක සභාව** ස්ථාපිත කරන තෙක් මෙම අනුකාරක සභාව ක්‍රියාත්මක වූ අතර, එය වෙත පහත සඳහන් කාර්යභාරය පැවරී තිබිණි:

(i) අමාත්‍ය මණ්ඩල සංදේශවල සඳහන් ආර්ථික කටයුතු, මුදල් ප්‍රතිපත්ති සහ රාජ්‍ය මූල්‍ය කටයුතුවලට අදාළ කරුණු පරීක්ෂා කර බලා, අමාත්‍ය මණ්ඩලය වෙත නිර්දේශ ඉදිරිපත් කිරීම;

(ii) ජාතික ආයෝජන වැඩසටහන හා රාජ්‍ය ආයෝජන වැඩසටහන පිළියෙල කිරීමේදී මාර්ගෝපදේශ ලබා දීම සහ පෞද්ගලික අංශයේ ආයෝජන සඳහා පහසුකම් සැලසීම;

(iii) ආර්ථික හා මූල්‍ය බලපෑම් සහිත යෝජනා පිළිබඳව අමාත්‍ය මණ්ඩලය වෙත නිර්දේශ ඉදිරිපත් කිරීම; සහ

(iv) රටේ ආයෝජනය/ආර්ථික සංවර්ධනය කෙරෙහි සෘජුව බලපාන විවිධ ව්‍යවස්ථා ක්‍රියාත්මක කිරීම පිළිබඳව අධීක්ෂණය කිරීම.

මෙම අනුකාරක සභාවේ සංයුතිය පහත පරිදි විය:

* අග්‍රාමාත්‍යතුමා - (සභාපති);
* මුදල් අමාත්‍යතුමා;
* විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමා; සහ
* මහාමාර්ග, උසස් අධ්‍යාපන හා ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යතුමා.

එසේම මෙම අනුකාරක සභාවට සහාය වීම පිණිස පහත සඳහන් ජ්‍යෙෂ්ඨ නිලධාරිහු අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරනු ලැබූහ:

* ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමාගේ උපදේශක;
* ගරු අග්‍රාමාත්‍යතුමාගේ ජ්‍යෙෂ්ඨ උපදේශක;
* අමාත්‍ය මණ්ඩලයේ ලේකම්;
* මුදල් අමාත්‍යාංශයේ ලේකම්;
* ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශයේ ලේකම්; සහ
* අග්‍රාමාත්‍ය කාර්යාලයේ අතිරේක ලේකම්වරයෙකු

එහිදී අග්‍රාමාත්‍ය ලේකම්වරයා හෝ ඔහු විසින් නම් කරනු ලබන ජ්‍යෙෂ්ඨ නිලධාරියකු මෙම අනුකාරක සභාවේ ලේකම්/ කැඳවුම්කරු වශයෙන් කටයුතු කළ යුතු බවටත්, කමිටුවේ කාර්යයන් සඳහා අවශ්‍ය යයි සැලකෙන අන් කවර හෝ නිලධාරින්ගේ/විශේෂඥයින්ගේ සේවය කමිටුව විසින් ලබා ගත හැකි බවටත්, තීරණය කෙරිණි.

2015-09-22 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී ඉහත ආර්ථික කටයුතු පිළිබඳ අමාත්‍ය මණ්ඩල අනුකාරක සභාව වෙනුවට **ආර්ථික කළමනාකරණය පිළිබඳ අමාත්‍ය කාරක සභාව** අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන ලදී.

ඒ අනුව, ආර්ථික කළමනාකරණයට අදාළ කරුණු සම්බන්ධයෙන් සුදුසු නිර්දේශ ඉදිරිපත් කිරීම සඳහා පහත සඳහන් අමාත්‍යවරු එම අමාත්‍ය මණ්ඩල කාරක සභාවේ සාමාජිකයින් ලෙස පත් කරනු ලැබූහ:

* ගරු රනිල් වික්‍රමසිංහ මැතිතුමා,
  අග්‍රාමාත්‍ය සහ
  ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍ය (සභාපති);

* ගරු නිමල් සිරිපාල ද සිල්වා මැතිතුමා,
  ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍ය;

* ගරු රවුෆ් හකීම් මැතිතුමා,
  නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍ය;

* ගරු අනුර ප්‍රියදර්ශන යාපා මැතිතුමා,
  ආපදා කළමනාකරණ අමාත්‍ය;

* ගරු රවි කරුණානායක මැතිතුමා,
  මුදල් අමාත්‍ය;

* ගරු පාඨලී චම්පික රණවක මැතිතුමා,
  මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍ය;

* ගරු කබීර් හෂීම් මැතිතුමා,
රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන අමාත්‍ය;

* ගරු අර්ජුන රණතුංග මැතිතුමා,
වරාය හා නාවික කටයුතු අමාත්‍ය;

* ගරු සාගල රත්නායක මැතිතුමා,
නීතිය හා සාමය සහ දක්ෂිණ සංවර්ධන අමාත්‍ය; සහ

* ගරු මලික් සමරවික්‍රම මැතිතුමා,
සංවර්ධන උපායමාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍ය.

**(ඇ) ආයතන කටයුතු පිළිබඳ අමාත්‍ය මණ්ඩල අනුකාරක සභාව:**

**(i)** ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනුව ආයතන කටයුතුවලට අදාළව පහත සඳහන් බලතල අමාත්‍ය මණ්ඩලය වෙත පැවරී ඇත:

- රජයේ නිලධරයන් පත් කිරීම, උසස් කිරීම, මාරු කිරීම, ඔවුන් විෂයයෙහි විනය පාලනය සහ ඔවුන් සේවයෙන් පහ කිරීම ඇතුළු, රජයේ නිලධරයන්ට අදාළ සියලු ප්‍රතිපත්තිමය කාරණා සම්බන්ධයෙන් විධිවිධාන සැලැස්වීම **[**55 වැනි ව්‍යවස්ථාවේ (1) වන අනුව්‍යවස්ථාව**].**

- දෙපාර්තමේන්තු ප්‍රධානීන් පත් කිරීම, උසස් කිරීම, මාරු කිරීම, ඔවුන් විෂයයෙහි විනය පාලනය සහ ඔවුන් සේවයෙන් පහ කිරීම **[**55 වැනි ව්‍යවස්ථාවේ (2) වන අනුව්‍යවස්ථාව**].**

මෙම බලතල ක්‍රියාත්මක කිරීමේදී යෝග්‍යතම තීරණයට එළඹීමට අමාත්‍ය මණ්ඩලයට පහසු වනු පිණිස අමාත්‍යාංශවලින් ඉදිරිපත් කෙරුණු සංදේශ ගැඹුරින් අධ්‍යයනය කර අමාත්‍ය මණ්ඩලය වෙත නිර්දේශ ඉදිරිපත් කිරීම ආයතන කටයුතු පිළිබඳ අමාත්‍ය මණ්ඩල අනුකාරක සභාවේ කාර්ය භාරය වේ.

**(ii)** මෙයට අමතරව අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, රාජ්‍ය ව්‍යවසායයන් හා ව්‍යවස්ථාපිත ආයතනයන්හි වාර්ෂික පරිපාලන වාර්තා/ කාර්යසාධන වාර්තා පාර්ලිමේන්තුවේ සභාගත කිරීම පිණිස අනුමැතිය ලබා ගැනීමට අදාළ අමාත්‍ය මණ්ඩල සංදේශ පරීක්ෂා කර ඊට අදාළ නිර්දේශ ඉදිරිපත් කිරීමේ වගකීමද 2015 වසරේදී ආයතන කටයුතු පිළිබඳ අමාත්‍ය මණ්ඩල අනුකාරක සභාව වෙත පවරනු ලැබිණි.

**(iii)** 2015 වසර තුළ 2015 අගෝස්තු 17 දිනට පෙර පහත සඳහන් අමාත්‍යවරුන්ගෙන් ආයතන කටයුතු පිළිබඳ අමාත්‍ය මණ්ඩල අනුකාරක සභාව සමන්විත විය.

- ගරු කරු ජයසූරිය මැතිතුමා
  රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ප්‍රජාතාන්ත්‍රීය පාලන අමාත්‍ය - (සභාපති);
- ගරු රවි කරුණානායක මැතිතුමා
  මුදල් අමාත්‍ය
- ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මැතිතුමා
  සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය අමාත්‍ය
- ගරු විජයදාස රාජපක්ෂ මැතිතුමා
  අධිකරණ හා කම්කරු සබඳතා අමාත්‍ය;
- ගරු අකිල විරාජ් කාරියවසම් මැතිතුමා
  අධ්‍යාපන අමාත්‍ය

2015 අගෝස්තු 17 දින පැවති පාර්ලිමේන්තු මහ මැතිවරණයෙන් පසු පත් වූ නව රජය යටතේ ආයතන කටයුතු පිළිබඳ අමාත්‍ය මණ්ඩල අනුකාරක සභාව පහත සඳහන් අමාත්‍යවරුන්ගෙන් සමන්විත විය.

- ගරු විජයදාස රාජපක්ෂ මැතිතුමා
  බුද්ධ ශාසන අමාත්‍ය සහඅධිකරණ අමාත්‍ය -(සභාපති);
- ගරු අනුර ප්‍රියදර්ශන යාපා මැතිතුමා
  ආපදා කළමනාකරණ අමාත්‍ය;
- ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මැතිතුමා;
  සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍ය
- ගරු රවි කරුණානායක මැතිතුමා
  මුදල් අමාත්‍ය;
- ගරු රංජිත් මද්දුම බණ්ඩාර මැතිතුමා
  රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍ය;
- ගරු තලතා අතුකෝරල මැතිතුමිය
  විදේශ රැකියා අමාත්‍ය;
- ගරු අකිල විරාජ් කාරියවසම් මැතිතුමා
  අධ්‍යාපන අමාත්‍ය;

**(iv)** දෙපාර්තමේන්තු ප්‍රධානීන් පත් කිරීම සඳහා වූ සංදේශ මෙම කාර්යාලය වෙත ලද වහාම නිර්දේශිත නිලධාරින් සම්බන්ධයෙන් විනයානුකූල ක්‍රියාමාර්ගයක් ගෙන ඇත්ද යන්න හෝ එසේ කිරීමට අදහස් කර ඇත්ද යන්න පිළිබඳව එම නිලධාරින් අයත් වන සේවාවන්වල පත්වීම් බලධරයා වෙතින් සහ පරිපාලන බලධරයා වෙතින් වාර්තා කැඳවා දෙපාර්තමේන්තු ප්‍රධානියකු පත් කිරීමේදී නිර්ණායකයක් ලෙස සලකා බලන ලදී.

(v) විවිධ අමාත්‍යාංශ වෙතින් 2015 වර්ෂය තුළදී ආයතන කටයුතු පිළිබඳ අමාත්‍ය මණ්ඩල අනුකාරක සභාවේ විෂයපථයට අදාළව අමාත්‍ය මණ්ඩල සංදේශ 601ක් ඉදිරිපත් වී තිබූ අතර, එම සංදේශ පිළිබඳව සාකච්ඡා කිරීමට ආයතන කටයුතු පිළිබඳ අමාත්‍ය මණ්ඩල අනුකාරක සභා රැස්වීම් 24ක් පවත්වන ලදී. අනුකාරක සභාවේ නිර්දේශ අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීමට පියවර ගෙන ඇත.

මෙම කාර්යභාරය සඳහා පහත නිලධාරීන්ගෙන් සමන්විත කමිටුවක් අමාත්‍ය මණ්ඩල අනුකාරක සභාවට සහාය වූ අතර, එම නිලධාරි කමිටුව සහභාගි වූ රැස්වීම් 24 ක් අදාළ වසර තුළ දී අමාත්‍ය මණ්ඩල කාර්යාලයේදී පැවැත්විණි.

- අමාත්‍ය මණ්ඩලයේ ලේකම්;
- රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශයේ* ලේකම්/අතිරේක ලේකම්; (* 2015-08-17 දිනට පෙර රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ප්‍රජාතාන්ත්‍රිය පාලන අමාත්‍යාංශය)
- භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම්;
- ආයතන අධ්‍යක්ෂ ජනරාල්;
- ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්;
- කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල්;
- ආරාධනා මත අදාළ අමාත්‍යාශවල නිලධාරීන් (අවස්ථානුකූලව); සහ
- අමාත්‍ය මණ්ඩල කාර්යාලයේ අතිරේක ලේකම්වරයා සහ අදාළ අනෙකුත් නිලධාරීන්.

එසේම අවශ්‍ය අවස්ථාවලදී ඇතැම් කරුණු පිළබඳව ජාතික වැටුප් කොමිෂන් සභාවේ නිර්දේශ ලබාගැනීමට ද කටයුතු කරන ලදී. අමාත්‍ය මණ්ඩල අනුකාරක සභාව විසින් ඉදිරිපත් කරන ලද නිර්දේශ අමාත්‍ය මණ්ඩලය විසින් සලකා බලා, ඉහත කී අමාත්‍ය මණ්ඩල සංදේශ 601 සම්බන්ධයෙන්ම සිය තීරණ ලබා දී ඇති අතර, එකී තීරණ ක්‍රියාත්මක කිරීම සඳහා අදාළ අමාත්‍යාංශ ලේකම්වරුන් වෙත හා අනෙකුත් අදාළ ආයතන වෙත අමාත්‍ය මණ්ඩල කාර්යාලය විසින් අදාළ තීරණ යවනු ලැබ ඇත.

2015 වසර තුළ අමාත්‍ය මණ්ඩලය විසින් දෙපාර්තමේන්තු ප්‍රධානීන් 53 ක් පත් කිරීම සම්බන්ධයෙන් තීරණ ගන්නා ලද අතර ඒ සඳහා වූ පත්වීම් ලිපි අමාත්‍ය මණ්ඩලයේ ලේකම්වරයා විසින් නිකුත් කරන ලදී.

**(ඇ) ව්‍යවස්ථා කටයුතු පිළිබඳ අමාත්‍ය මණ්ඩල අනුකාරක සභාව:**

අලුතින් නීති සම්පාදනය කිරීම සඳහා හෝ පවතින නීතියක් සංශෝධනය කිරීම සඳහා හෝ අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ඇතිව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු වන පනත් කෙටුම්පත් ඇතුළත් සංදේශ ගැඹුරින් අධ්‍යයනය කර, සිය නිර්දේශ අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීම පිණිස පහත සඳහන් ගරු

අමාත්‍යවරුන්ගෙන් සැදුම්ලත් අමාත්‍ය මණ්ඩල අනුකාරක සභාවක් 2015 පෙබරවාරි මස 18 දින පැවැත් වූ අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරනු ලැබ තිබිණ:

- ගරු විජයදාස රාජපක්ෂ මැතිතුමා
  අධිකරණ හා කම්කරු සබඳතා පිළිබඳ අමාත්‍ය - (සභාපති);
- ගරු මංගල සමරවීර මැතිතුමා
  විදේශ කටයුතු අමාත්‍ය;
- ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මැතිතුමා
  වැවිලි කර්මාන්ත අමාත්‍ය; සහ
- ගරු රාවුෆ් හකීම් මැතිතුමා
  නාගරික සංවර්ධන, ජල සම්පාදන සහ ජලාපවහන අමාත්‍ය.

2015 අගෝස්තු 17 දින පැවති පාර්ලිමේන්තු මහ මැතිවරණයෙන් පසු පත් වූ නව රජය යටතේ ව්‍යවස්ථා කටයුතු පිළිබඳ අමාත්‍ය මණ්ඩල අනුකාරක සභාව පහත සඳහන් අමාත්‍යවරුන්ගෙන් සමන්විත විය.

- ගරු විජයදාස රාජපක්ෂ මැතිතුමා
  අධිකරණ අමාත්‍ය - (සභාපති);
- ගරු මංගල සමරවීර මැතිතුමා
  විදේශ කටයුතු අමාත්‍ය;
- ගරු අනුර ප්‍රියදර්ශන යාපා මැතිතුමා
  ආපදා කළමනාකරණ අමාත්‍ය;
- ගරු සුසිල් ප්‍රේමජයන්ත මැතිතුමා
  විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍ය;
- ගරු තිලක් මාරපන මැතිතුමා
  නීතිය, සාමය හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍ය;
  (2015 නොවැම්බර් 09 දින දක්වා)
- ගරු නවින් දිසානායක මැතිතුමා
  වැවිලි කර්මාන්ත අමාත්‍ය.

එම අනුකාරක සභාවට සහාය වීම පිණිස අධිකරණ අමාත්‍යාංශයේ ලේකම්වරයා සහ අදාළ අමාත්‍යාංශයන්හි නියෝජිතයන්ගෙන් සැදුම්ලත් නිලධාරි කමිටුවක් අමාත්‍ය මණ්ඩලය විසින් පත් කර තිබුණි.

ව්‍යවස්ථා කටයුතු පිළිබඳ අමාත්‍ය මණ්ඩල අනුකාරක සභාව වෙත 2015 වර්ෂයේදී අමාත්‍ය මණ්ඩල සංදේශ 40 ක් යොමු කරනු ලැබීය. ඊට අදාළ නිර්දේශ අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කරන ලද අතර, අමාත්‍ය මණ්ඩලයේ තීරණ ක්‍රියාත්මක කිරීම සඳහා අදාළ අමාත්‍යාංශ ලේකම්වරුන් වෙත අදාළ තීරණ යවන ලදී.

**(ඉ) ප්‍රසම්පාදන කටයුතු පිළිබඳ අමාත්‍ය මණ්ඩල අනුකාරක සභාව**

අනවශ්‍ය වියදම් මඟහරවා ගැනීම පිණිස සහ රජයේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය පිළිබඳව මහජන විශ්වාසය නැවත ඇති කිරීම පිණිස, රාජ්‍ය මූල්‍ය කළමනාකරණය පිළිබඳ ප්‍රශස්ත ක්‍රමවේද අනුගමනය කරමින්, විනිවිදභාවයෙන් යුතුව ප්‍රසම්පාදන සම්බන්ධයෙන් තීරණ ගැනීම සහතික වීමේ කාර්යභාරය මෙම අනුකාරක සභාව වෙත පැවරී තිබුණු අතර, එහි සංයුතිය පහත සඳහන් පරිදි විය:

* රාජ්‍ය පරිපාලන, පළාත් සභා, පළාත් පාලන හා ප්‍රජාතාන්ත්‍රීය පාලනය පිළිබඳ අමාත්‍යතුමා - (සභාපති);
* වැවිලි කර්මාන්ත අමාත්‍යතුමා;
* මුදල් අමාත්‍යතුමා; සහ
* විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමා.

මෙම අනුකාරක සභාව සඳහා සහාය වීම පිණිස පහත සඳහන් ජ්‍යෙෂ්ඨ නිලධාරිහු පත් කරනු ලැබූහ.

* ජනාධිපති ලේකම්වරයා හෝ ඔහු විසින් නම් කරනු ලබන නියෝජිතයකු;
* අග්‍රාමාත්‍ය ලේකම්වරයා හෝ ඔහු විසින් නම් කරනු ලබන නියෝජිතයකු;
* අමාත්‍ය මණ්ඩලයේ ලේකම්වරයා හෝ ඔහු විසින් නම් කරනු ලබන නියෝජිතයකු;
* මුදල් අමාත්‍යාංශයේ ලේකම්වරයා හෝ ඔහු විසින් නම් කරනු ලබන නියෝජිතයකු;
* ජාතික අයවැය අධ්‍යක්ෂ ජනරාල්; සහ
* රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්.

මහා භාණ්ඩාගාරයේ ලේකම්වරයා හෝ ඔහු විසින් නම් කරනු ලබන මහා භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම්වරයෙකු මෙම අනුකාරක සභාවේ ලේකම්/ කැඳවුම්කරු වශයෙන් කටයුතු කළ යුතු බවටද, කමිටුවේ කාර්යයන් සඳහා අවශ්‍ය යයි සැලකෙන අන් කවර හෝ

නිලධාරින්ගේ/විශේෂඥයින්ගේ සේවය කමිටුව විසින් ලබා ගත හැකි බවටද, තීරණය කෙරිණි.

**(ඊ) ජීවන වියදම් පිළිබඳ අමාත්‍ය මණ්ඩල අනුකාරක සභාව**

2015-09-22 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී, ජීවන වියදමට අදාළ කරුණු පිළිබඳව අවශ්‍ය නිර්දේශ අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීම පිණිස පහත සඳහන් අමාත්‍යවරුන්ගෙන් සැදුම්ලත් ඉහත අනුකාරක සභාව අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන ලදී:

* මලික් සමරවික්‍රම මැතිතුමා,
  සංවර්ධන උපායමාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍ය - (සභාපති) ;
* ගරු ඩබ්ලිව්.ඩී.ජේ.සෙනෙවිරත්න මැතිතුමා,
  කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය;
* ගරු රවි කරුණානායක මැතිතුමා,
  මුදල් අමාත්‍ය;
* ගරු පී.හැරිසන් මැතිතුමා,
  ග්‍රාමීය ආර්ථිකය පිළිබඳ අමාත්‍ය;
* ගරු අකිල විරාජ් කාරියවසම් මැතිතුමා,
  අධ්‍යාපන අමාත්‍ය;

එසේම කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශයේ ලේකම්වරයා මෙම අනුකාරක සභාවේ ලේකම්/ කැඳවුම්කරු වශයෙන් ක්‍රියා කළ යුතු බවට අමාත්‍ය මණ්ඩලය විසින් තීරණය කරන ලදී.

**(උ) අධ්‍යාපනය පිළිබඳ අමාත්‍ය මණ්ඩල අනුකාරක සභාව:**

ජාතික අධ්‍යාපන ප්‍රතිපත්තිය සකස් කිරීම හා පාසල් අධ්‍යාපන නව පනතක් සකස් කිරීම, තාක්ෂණික හා වෘත්තීය අධ්‍යාපනය පුළුල් කිරීම ක්‍රමවත් කිරීම පිණිස මාර්ගෝපදේශ ලබා දීම, පෙර පාසල් සඳහා ජාතික ප්‍රතිපත්තියක් සම්පාදනය කිරීම පිණිස මාර්ගෝපදේශ ලබා දීම, විශ්වවිද්‍යාල අධ්‍යාපනය ප්‍රතිව්‍යුහගත කිරීමේ ක්‍රියාවලියට අදාළ කටයුතු සිදු කිරීම සහ අධ්‍යාපනය පිළිබඳ රජයේ පොදු වැඩසටහනේ අරමුණු සාක්ෂාත් කර ගැනීම පිණිස නිසි ක්‍රියාමාර්ග ගැනීම යන කර්තව්‍යයන් ඉටු කිරීම සඳහා 2015-10-14 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය මගින් මෙම අමාත්‍ය අනුකාරක සභාව පත් කරනු ලැබිණි.

ගරු අග්‍රාමාත්‍යතුමා සහ පහත සඳහන් අමාත්‍යවරු හය (06) දෙනෙකුගෙන් මෙම අමාත්‍ය මණ්ඩල අනුකාරක සභාව සමන්විත විය.

* ගරු රනිල් වික්‍රමසිංහ මැතිතුමා,
  අග්‍රාමාත්‍ය - (සභාපති);

* ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මැතිතුමා,
  උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍ය;

* ගරු සුසිල් ප්‍රේමජයන්ත මැතිතුමා,
  විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍ය;

* ගරු මහින්ද සමරසිංහ මැතිතුමා,
  නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු අමාත්‍ය;

* ගරු අකිල විරාජ් කාරියවසම් මැතිතුමා,
  අධ්‍යාපන අමාත්‍ය;

* ගරු සාගල රත්නායක මැතිතුමා,
  නීතිය හා සාමය සහ දක්ෂිණ සංවර්ධන අමාත්‍ය; සහ

* ගරු හරීන් ප්‍රනාන්දු මැතිතුමා,
  විදුලි සංදේශ හා ඩිජිටල් යටිතල පහසුකම් අමාත්‍ය;

**4.3 විවිධ විෂයයන් සම්බන්ධයෙන් අධ්‍යයනය කොට නිර්දේශ ඉදිරිපත් කිරීම සඳහා අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරනු ලබන නිලධාරි කමිටුවලට අදාළ කටයුතු:**

අමාත්‍ය මණ්ඩල රැස්වීම්වලදී මතු වූ විවිධ කරුණු පිළිබඳව වැඩිදුර අධ්‍යයනය කොට නිර්දේශ ඉදිරිපත් කිරීම සඳහා අමාත්‍ය මණ්ඩලය විසින් 2015 වසරේදී අමාත්‍ය කමිටු 26 ක් හා නිලධාරි කමිටු 24 ක් පත් කරන ලද අතර එම කමිටු විසින් ඉදිරිපත් කරන ලද නිර්දේශ ඇතුළත් වාර්තා 14 ක් 2015 වසර තුළ අමාත්‍ය මණ්ඩලය වෙත යොමු කොට ඒ අනුව ගනු ලැබූ අමාත්‍ය මණ්ඩල තීරණ ක්‍රියාත්මක කිරීම පිණිස අදාළ අමාත්‍යාංශ ලේකම්වරුන් හා ආයතන වෙත දන්වා යවන ලදී.

**4.4 උපරිමාධිකරණයන්හි විභාගයට ගැනෙමින් පවතින නඩු කටයුතු සඳහා අවශ්‍ය වන තොරතුරු සහ අමාත්‍ය මණ්ඩල තීරණ නීතිපති දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කිරීම:**

අමාත්‍ය මණ්ඩලය හෝ අමාත්‍ය මණ්ඩල ලේකම්වරයා වගඋත්තරකරුවන් ලෙස නම් කෙරුණු ශ්‍රේෂ්ඨාධිකරණ (මූලික අයිතිවාසිකම්) අයදුම්පත් සහ අභියාචනාධිකරණ (රිට් ආඥා) අයදුම්පත් කිහිපයක දිවුරුම් පෙත්සම්/ පෙත්සම්වල අන්තර්ගත කරුණු සම්බන්ධයෙන් අමාත්‍ය මණ්ඩලයේ

ලේකම්වරයාගේ නිරීක්ෂණ නීතිපති දෙපාර්තමේන්තුව විසින් ඉල්ලා සිටින ලද අතර, ඒ අනුව අදාළ අමාත්‍ය මණ්ඩල තීරණයන්හි පිටපත්ද සමඟින් ඒ සම්බන්ධයෙන් වූ නිරීක්ෂණ නීතිපති දෙපාර්තමේන්තුව වෙත ඉක්මණින් ලබා දීමට කටයුතු කරන ලදී. තවද, නීතිපති දෙපාර්තමේන්තුව වරින් වර සිදු කළ ඉල්ලීම් පරිදි, ඉකුත් අමාත්‍ය මණ්ඩල තීරණ සම්බන්ධයෙන් සවිස්තර තොරතුරු, ඒ හා සම්බන්ධ ලිපිලේඛන සමඟ එකී දෙපාර්තමේන්තුව වෙත කඩිනමින් ලැබීමට සලස්වන ලදී. 2015 වර්ෂය තුළ අමාත්‍ය මණ්ඩල කාර්යාලය විසින් නඩු කටයුතු 31 ක් සම්බන්ධයෙන් නීතිපති දෙපාර්තමේන්තුව සමඟ කටයුතු කරන ලදී. ඒ අනුව 2014 වර්ෂයේ දී කටයුතු කිරීමට සිදු වූ නඩු කටයුතු ගණන වූ 13ක් සමඟ සැසඳීමේදී 2015 වර්ෂයේදී මෙම සංඛ්‍යාවේ සැලකිය යුතු ඉහළ යාමක් පෙන්නුම් කරයි.

## 4.5 2015 වසර තුළ සිදු කරන ලද විශේෂයෙන් සඳහන් කළ යුතු කාර්යභාරයන්:

4.5.1 අමාත්‍ය මණ්ඩලයේ සාමූහික වගකීම පිළිබඳ සහ එහි රහස්‍යභාවය රැකීම පිළිබඳ සියලුම අමාත්‍යවරුන් විසින් (ස්වේච්ඡාවෙන් ඉදිරිපත් කරනු ලබන) දිවුරුම් ප්‍රකාශයක් ලබා දීමට අවශ්‍ය පහසුකම් සලසන ලදී.

4.5.2 බංගලාදේශ රජයේ අමාත්‍ය මණ්ඩල ලේකම්වරයා ඇතුළු එම නියෝජිත කණ්ඩායම ශ්‍රී ලංකාවේ නිල සංචාරයක නිරත වන අතරතුර අමාත්‍ය මණ්ඩල කාර්යාලයටද පැමිණි අතර එම කණ්ඩායම සමඟ තොරතුරු හුවමාරු කර ගැනීමේ සාකච්ඡාවක් පවත්වන ලදී.

4.5.3 ආර්ථික කටයුතු පිළිබඳ අමාත්‍ය අනුකමිටුවට/ආර්ථික කළමනාකරණය පිළිබඳ අමාත්‍ය මණ්ඩල කාරක සභාවට සහය වීම පිණිස පත් කරන ලද නිලධාරි කමිටුවේ සාමාජිකයෙකු වශයෙන් අමාත්‍ය මණ්ඩල ලේකම්වරයා කටයුතු කරන ලදී.

4.5.4 2015 අප්‍රේල් 16-17 දිනයන්හිදී පාකිස්ථානයේ, ඉස්ලාමාබාද් නුවර පැවති සාක් රටවල අමාත්‍ය මණ්ඩල ලේකම්වරුන්ගේ 03 වන රැස්වීමට ශ්‍රී ලංකාව නියෝජනය කරමින් අමාත්‍ය මණ්ඩල කාර්යාලයේ අතිරේක ලේකම්වරයෙකු සහ සහකාර ලේකම්වරයෙකු සහභාගි විය.

4.5.5 මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාසය සහ බරපතළ වංචා, දූෂණ, රජය සම්පත් වරප්‍රසාද බලය සහ අධිකාරිය අනිසි ලෙස භාවිත කිරීම සම්බන්ධයෙන් විමර්ශනය කිරීම සඳහා පත්කරනු ලැබ ඇති ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාවේ ඉල්ලීම් මත විමර්ශන කටයුතු සඳහා අවශ්‍ය පැරණි අමාත්‍ය මණ්ඩල තීරණ, සංදේශ හා වාර්තා කඩිනමින් නිකුත් කිරීමට කටයුතු කිරීම.

4.5.6 අමාත්‍ය මණ්ඩල ලේකම්වරයා සාමාජිකයෙකු ලෙස විවිධ කමිටුවල ක්‍රියා කරන ලද අතර ආයතන කටයුතු පිළිබඳ අමාත්‍ය අනු කමිටුවට සහය වන නිලධාරි කමිටුවේ සභාපති ලෙසද ඔහු කටයුතු කරන ලදී. 2015 වර්ෂයේදී එම නිලධාරි කමිටුවේ රැස්වීම් වාර 24ක් පවත්වන ලදී.

4.5.7 අමාත්‍ය මණ්ඩල කාර්යාලයේ කාර්ය භාරය පුළුල් කිරීමේදී බාධකයක්ව පවතින එය දැනට ස්ථාපිත කර ඇති කොළඹ කොටුව ජනරජ ගොඩනැඟිල්ලේ ඊට වෙන් කර ඇති ඉඩ කඩ ප්‍රමාණවත් නොවීම හා එහි සිදු කළ යුතු අලුත්වැඩියාවන් පිළිබඳ ගැටලු නිරාකරණය කර ගැනීම සම්බන්ධයෙන් පහත සඳහන් උත්සාහයන් දරන ලදී.

4.5.7.1 2015-04-21 දින අනපේක්ෂිත පරිදි ජනරජ ගොඩනැඟිල්ලේ වැහිපීලි උතුරා යාමෙන් කාර්යාල පරිශ්‍රය තුළට වැසි ජලය කාන්දු වීම සම්බන්ධයෙන් අතිගරු ජනාධිපතිතුමා දැනුවත් කර ඉන් හානියට ලක් වූ ලිපිගොනු ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුවේ සහාය ඇතිව යථාවත් කිරීම සහ ගොඩනැඟිල්ලේ අත්‍යවශ්‍ය අලුත්වැඩියාවන් සිදු කිරීම.

4.5.7.2 කොළඹ කොටුව ප්‍රදේශයේ පිහිටි රජයේ ආයතන වෙනත් ස්ථානයන්හි ස්ථාපිත කිරීමේ රජයේ ප්‍රතිපත්තිය අනුව අමාත්‍ය මණ්ඩල කාර්යාලය වෙනත් ස්ථානයක ස්ථාපනය කිරීමේ අරමුණින් සෙත්සිරිපාය II අදියර හෝ නාගරික සංවර්ධන අධිකාරිය භාරයේ පවතින වෙනත් සුදුසු ගොඩනැඟිල්ලක ඉඩ පහසුකම් සලසා ගනු පිණිස එවකට නාගරික සංවර්ධන, ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙතින් විමසීම.

4.5.7.3 අමාත්‍ය මණ්ඩල කාර්යාලය සඳහා ජනරජ ගොඩනැඟිල්ලේ ඊට වෙන් කර ඇති ඉඩ කඩ ප්‍රමාණවත් නොවීම සම්බන්ධයෙන් කැබිනට් මණ්ඩලය දැනුම්වත් කිරීම.

## 5. අමාත්‍ය මණ්ඩල කාර්යාලයේ කාර්යභාරයේ විශේෂත්වය:

අමාත්‍ය මණ්ඩල කාර්යාලය වෙත පැවරී ඇති කාර්යභාරයේ සුවිශේෂත්වය නිසා බොහෝ අවස්ථාවලදී අනෙකුත් රජයේ ආයතනවල කටයුතු කෙරෙන සාමාන්‍ය ආකාරයෙන් බැහැරව කටයුතු කිරීමට අමාත්‍ය මණ්ඩල කාර්යාලයට සිදු වේ. විශේෂයෙන්ම අමාත්‍ය මණ්ඩල රැස්වීම් දෙකක් අතර කාල පරතරය සතියකට පමණක් සීමා වන බැවින්, පහත ආකාරයේ කල් දැමිය නොහැකි කාර්යභාරයන් රැසක් ඉතාම කෙටි කාලයක් තුළ ඉටු කිරීම අමාත්‍ය මණ්ඩල කාර්යාලයේ කාර්ය මණ්ඩලය වෙත පැවරී ඇත.

* සතියේ අමාත්‍ය මණ්ඩල රැස්වීමේ වාර්තාව එම සතියේ බ්‍රහස්පතින්දා පෙරවරුව වන විට භාෂාත්‍රයෙන් පිළියෙල කිරීම.

* ඊළඟ අමාත්‍ය මණ්ඩල රැස්වීමේ න්‍යාය පත්‍රයට ඇතුළත් කිරීමට අදහස් කෙරෙන අමාත්‍ය මණ්ඩල සංදේශවල අන්තර්ගත කරුණු පිළිබඳව අධ්‍යයනය කිරීම.

* එම සංදේශවලට අදාළ අවශ්‍ය අතිරේක තොරතුරු රැස් කිරීම හා එම කරුණු සම්බන්ධයෙන් මීට පෙර අමාත්‍ය මණ්ඩල තීරණ කිසිවක් තිබේ නම් ඒ පිළිබඳ තොරතුරු සොයා බැලීම.

* ඇතැම් සංදේශවල සඳහන් යෝජනාවන් ක්‍රියාත්මක කිරීමේදී පැන නැඟිය හැකි ප්‍රතිපත්තිමය හා නෛතික සංකූලතා ගැන අධ්‍යයනය කිරීම. (අමාත්‍ය මණ්ඩලයේ ලේකම්වරයා හා ජ්‍යෙෂ්ඨ නිලධාරීන් විසින්)

* එම සංදේශවල අන්තර්ගත කරුණු සම්බන්ධයෙන් අදාළ වන පරිදි, ඒ ඒ අමාත්‍යාංශ භාර ගරු අමාත්‍යතුමන් වෙතින් නිරීක්ෂණ ලබාගැනීම.

මෙම සියලු කටයුතු කිරීමේදී එම කරුණු සම්බන්ධයෙන් රහස්‍යභාවය ආරක්ෂා කිරීම නිලධාරීන්ගේ වගකීමක් වන අතර, එය ඉහළ මට්ටමින් පවත්වා ගනිමින්, සතියේ දිනවල සාමාන්‍ය රාජකාරි වේලාවන් ඉක්මවා රාත්‍රී කාලයේ රාජකාරියේ නිරත වීමටත්, සති අන්ත දිනවල හා රජයේ නිවාඩු දිනවල සේවයේ යෙදීමටත් අමාත්‍ය මණ්ඩල කාර්යාලයේ නිලධාරීන්ට සිදු විය.

මෙම හේතුව නිසා අමාත්‍ය මණ්ඩල කාර්යාලයට නිලධාරීන් බඳවා ගනු ලැබීමේදී ඉහත සඳහන් අවශ්‍යතාවයන්ට ගැළපෙන, විශේෂයෙන් තෝරාගත්, කුසලතා සහිත නිලධාරීන් පිරිසක් බඳවාගැනීමට කටයුතු කරනු ලැබ ඇති අතර, 2015 වර්ෂය තුළ අමාත්‍ය මණ්ඩල කාර්යාලයේ සේවයේ යෙදුණු නිලධාරීන් පිළිබඳ තොරතුරු 6 වන ඡේදයෙහි ඇතුළත් වේ.

විශේෂයෙන්ම පළපුරුදු භාෂා පරිවර්තකයින්ගේ හිඟය හේතු කොට ගෙන භාෂා පරිවර්තන කටයුතු සඳහා විශ්‍රාමික නිලධාරීන් දෙදෙනෙකුගේ සේවය 2015 වසර තුළද තවදුරටත් ලබාගැනීමට අමාත්‍ය මණ්ඩල කාර්යාලයට සිදු විය.

## 6. මානව සම්පත් කළමනාකරණය:

මානව සම්පත් සංවර්ධනය හා කළමනාකරණය අමාත්‍ය මණ්ඩල කාර්යාලයීය ප්‍රමුඛතා ලැයිස්තුවේ සුවිශේෂ ස්ථානයක් උසුළයි.

### 6.1 2015-12-31 දිනට සේවක සංඛ්‍යා තොරතුරු

*වගුව 2 – 2015-12-31 දිනට සේවා නියුක්තික වර්ගීකරණය*

| සේවක වර්ගය | අනුමත සංඛ්‍යාව | තථ්‍ය සංඛ්‍යාව | | | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත සංඛ්‍යාව |
|---|---|---|---|---|---|---|
| | | ස්ථිර පදනම මත | කොන්ත්‍රාත් පදනම මත | එකතුව | | |
| ජ්‍යෙෂ්ඨ මට්ටම | 16 | 11 | 00 | 11 | 05 | - |
| තෘතියික මට්ටම | 10 | 08 | 02 | 10 | 00 | - |
| ද්විතියික මට්ටම | 32 | 24 | 01 | 25 | 07 | - |
| ප්‍රාථමික මට්ටම | 32 | 25 | 00 | 25 | 07 | - |
| එකතුව | **90** | 68 | 03 | **71** | **19** | - |

### 6.2 2015-12-31 දිනට සිටි කාර්ය මණ්ඩලය

*වගුව 3 - 2015-12-31 දිනට කාර්ය මණ්ඩල විස්තරය*

| | තනතුර | අනුමත සංඛ්‍යාව | තථ්‍ය සංඛ්‍යාව | පුරප්පාඩු |
|---|---|---|---|---|
| 01. | ලේකම් | 01 | 01 | - |
| 02. | අතිරේක ලේකම් | 03 | 01 | 02 |
| 03. | ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් | 04 | 02 | 02 |
| 04. | සහකාර ලේකම් (ශ්‍රී ලං.ප.සේ.) | 05 | 04 | 01 |
| 05. | ගණකාධිකාරී | 01 | 01 | - |
| 06. | සහකාර ලේකම් (ශ්‍රී ලං.ප.සේ. නොවන) | 01 | 01 | - |
| 07. | සහකාර අධ්‍යක්ෂ - තොරතුරු තාක්ෂණ | 01 | 01 | - |
| 08. | භාෂා උපදේශක * | 01 | 01 | - |
| 09. | පරිපාලන නිලධාරී | 01 | 01 | - |
| 10. | සම්බන්ධීකරණ ලේකම් | 01 | 01 | - |
| 11. | භාෂා සම්බන්ධීකාරක * | 01 | 01 | - |
| 12. | භාෂා පරිවර්තක | 05 | 05 | - |
| 13. | ප්‍රගති සහකාර | 01 | 01 | - |
| 14. | සංවර්ධන සහකාර | 02 | - | 02 |
| 15. | රාජ්‍ය කළමනාකරණ සහකාර | 27 | 24** | 03 |
| 16. | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සහකාර | 02 | 01 | 01 |
| 17. | පුස්තකාලයාධිපති | 01 | - | 01 |
| 18. | පිළිගැනීමේ නිලධාරී | 01 | - | 01 |
| 19. | රියැදුරු | 13 | 11 | 02 |
| 20. | කා.සේ.සේ. | 18 | **14** | **04** |
| | එකතුව | **90** | **71** | **19** |

**සටහන: *** කොන්ත්‍රාත් පදනම මත අනුමත කර තිබේ.

** තත්‍ය සංඛ්‍යාවෙන් 01 ක් කොන්ත්‍රාත් පදනම මත සේවයේ යොදවනු ලැබ ඇත.

**6.3 2015 වසර තුළ අමාත්‍ය මණ්ඩල කාර්යාලයේ සේවයට අලුතින් එක් වූ සේවක මහත්ම/මහත්මීන්.**

2015 වසර තුළ අමාත්‍ය මණ්ඩල කාර්යාලයේ කාර්ය මණ්ඩලය ශක්තිමත් කරමින් නිලධාරිහු දොළොස් දෙනෙක් (12) අමාත්‍ය මණ්ඩල කාර්යාලයේ සේවයට අලුතෙන් එක් වූහ.

**6.4 විශ්‍රාම ගැනීම්**

2015 වර්ෂය තුළ අමාත්‍ය මණ්ඩල කාර්යාලයේ සේවය කරමින් සිටි නිලධාරින් විශ්‍රාම යාමක් සිදු නොවිණි.

**6.5 ස්ථාන මාරුවීම්**

2015 වසර තුළ නිලධාරිහු හත් දෙනෙක් (07) ස්ථාන මාරුවීම් ලබා අමාත්‍ය මණ්ඩල කාර්යාලයෙන් වෙනත් සේවා ස්ථාන කරා නික්ම ගියහ.

**6.6 පුහුණුව හා සංවර්ධනය**

පුහුණුව හා සංවර්ධනය මඟින් සේවකයකුගේ හෝ නිලධාරියකුගේ දැනුම, ආකල්ප සහ කුසලතා වැඩිදියුණු කිරීම පමණක් නොව එය සේවකයන්ගේ අභිප්‍රේරණයටද හේතු වේ.

අංක 01/2014 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ විධිවිධාන අනුව රාජ්‍ය නිලධාරින් විසින් අත් කර ගත යුතු අනෙක් රාජ්‍ය භාෂාව පිළිබඳ ප්‍රවීණතාව ලබා ගැනීම සඳහා මෙම කාර්යාලයේ නිලධාරින්ට පහසුකම් සලසමින් අධ්‍යයන පොදු සහතික පත්‍ර (සා./පෙ.) විභාගය ඉලක්ක කර ගත් දෙමළ භාෂා පුහුණු පාඨමාලාවක් කාර්යාලයේ සේවයේ නියුතු ජ්‍යෙෂ්ඨ භාෂා පරිවර්තක නිලධාරියෙකුගේ සම්පත් දායකත්වයෙන් යුතුව 2015 වසරේදී පවත්වන ලදී.

2015 වසර තුළ අමාත්‍ය මණ්ඩල කාර්යාලය සිය සේවක මහත්ම මහත්මීන්ගේ ඉල්ලීම් සහ ඔවුන්ගේ පුහුණු අවශ්‍යතාවන්ද සැලකිල්ලට ගනිමින් සේවක මහත්ම/මහත්මීන් වෙත පුහුණුවීම් අවස්ථා කිහිපයක් ලබා දීමට කාර්යාලයට හැකි විය.

**මාණ්ඩලික ශ්‍රේණි** - පුහුණු අවස්ථා 04,
පාඨමාලා හා උසස් අධ්‍යාපන 01

**මාණ්ඩලික නොවන** - පුහුණු පාඨමාලා 03

මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරින්ට අදාළ පුහුණුවීම් අවස්ථා සම්බන්ධයෙන් විදේශ සම්පත් දෙපාර්තමේන්තුව විසින් කරන ලද දැනුම් දීම් අනුව ඒ සඳහා ඉල්ලුම් කිරීමට නිලධාරින් යොමු කිරීමේදී මුහුණ පෑමට සිදුවී ඇති ප්‍රධානතම ගැටලුව වන්නේ කාර්යාලයේ එම ශ්‍රේණියේ තනතුරු රාශියක් පුරප්පාඩුව තිබීම නිසා ඔවුන් එකී පුහුණුව සඳහා මුදා හැරීමට ඇති අපහසුතාවයි.

## 7. මූල්‍ය හා ගිණුම් කටයුතු සමාලෝචනය

### 7.1 ඇස්තමේන්තු:

අමාත්‍ය මණ්ඩල කාර්යාලයේ 2015 වර්ෂය සඳහා පුනරාවර්තන හා මූලධන වියදම් යටතේ මුළු ප්‍රතිපාදනයත් මුළු වියදමත් පහත පරිදි විය.

*වගුව 4 - 2015 වියදම් සාරාංශය*

| වියදමේ ස්වභාවය | මුළු ප්‍රතිපාදනය රු. | තථ්‍ය වියදම රු. | ප්‍රගතිය % | ඉතිරිය රු. |
|---|---|---|---|---|
| පුනරාවර්තන වියදම | 67,550,000/- | 62,900,036/- | 93% | 4,649,964/- |
| මූලධන වියදම | 9,850,000/-* | 2,663,066/- | 27% | 7,186,934/ |
| **මුළු එකතුව** | **77,400,000/-** | **65,563,102/-** | **85%** | **11,836,898/-** |

අමාත්‍ය මණ්ඩලය සතිපතා රැස්වන බැවින් යම් හෝ තාක්ෂණික ප්‍රමාදයක් සිදුවුවහොත් සමස්ත ක්‍රියාවලියම අඩපණ වීමට ඉඩ ඇති බැවින් අවශ්‍යයැයි තක්සේරු කරන ලද අවශ්‍ය අවම ප්‍රතිපාදන ප්‍රමාණය අයවැය ඇස්තමේන්තු මඟින් වෙන් කරගැනීමට කටයුතු කරන ලදී. එහෙත් රජයේ මුදල් අනවශ්‍ය අයුරින් වියදම් කිරීමෙන් තොරව අත්‍යවශ්‍ය කාර්යයන් සඳහා පමණක් වියදම් දැරීම හේතුවෙන්ද සංකූලතා බහුල ව්‍යාපෘතියක් වන ලේඛන කළමනාකරන ව්‍යාපෘතිය සඳහා වූ ප්‍රතිපාදන වැය නොවූ නිසාද යම් ප්‍රතිපාදන ඉතිරියක් 2015 වර්ෂය තුළදී පෙන්නුම් කරනු ලබයි.

මූලධන වත්කම් අත්පත් කරගැනීම් වැය විෂයන්හි ප්‍රතිපාදන උපයෝගී කරගනිමින්, 2015 වර්ෂය තුළ පරිගණක 13ක්, UPS යන්ත්‍ර 13ක්, පරිගණක මුද්‍රණ යන්ත්‍ර 08ක්, ෆැක්ස් යන්ත්‍රයක්, වානේ අල්මාරි 02ක්, වානේ කබඩ් 01ක්, පොත් රාක්කය 01ක්, අභ්‍යන්තර දූරකථන පද්ධතිය සඳහා ස්ථාවර දූරකථන 03ක්, නව ස්ථාවර දූරකථන 01ක් හා වාහන සේදීම සඳහා භාවිත කරනු ලබන අධි පීඩන ජල විදින යන්ත්‍රයක්ද මිල දී ගනු ලැබිණි.

*ලේඛන කළමනාකරන ව්‍යාපෘතිය සඳහා වෙන් කරන ලද රුපියල් මිලියන 06 ප්‍රතිපාදන අතුළත් ය.

### 7.2 නිලධාරින් සඳහා ණය අත්තිකාරම් ලබාදීම

2015 වර්ෂය තුළ මෙම කාර්යාලයේ නිලධාරින් සඳහා අත්තිකාරම් "බී" ගිණුම යටතේ පහත සඳහන් පරිදි රු. 2,497,046.00ක ණය පහසුකම් ලබා දී ඇත.

*වගුව 5 - අත්තිකාරම් "බී" ගිණුම යටතේ ලබා දෙන ලද ණය පහසුකම්*

| ලබාදුන් ණය වර්ගය | නිලධාරීන් සංඛ්‍යාව | ණය මුදල් ප්‍රමාණය (රුපියල්) |
|---|---|---|
| ආපදා ණය | 26 | 1,761,046.00 |
| උත්සව අත්තිකාරම් | 58 | 580,000.00 |
| විශේෂ අත්තිකාරම් | 39 | 156,000.00 |
| **එකතුව** | **123** | **2,497,046.00** |

## 7.3 වාර්ෂික ගිණුම් ඉදිරිපත් කිරීම:

2015 වර්ෂය සඳහා අමාත්‍ය මණ්ඩල කාර්යාලය විසින් ඉදිරිපත් කළ යුතු වාර්ෂික විසර්ජන ගිණුම **(ඇමුණුම III)**, අත්තිකාරම් "බී" ගිණුම **(ඇමුණුම IV)** විගණකාධිපතිවරයා වෙත යවා ඇත.

## 7.4 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය පැවැත්වීම:

2015 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණය නිම කොට අදාළ වාර්තාව විගණකාධිපතිවරයා වෙත යොමු කරනු ලැබ ඇත.

## 7.5 විගණන විමසුම්:

2015 වර්ෂය සඳහා විගණන විමසුම් තුනක් (03) ලැබී තිබූ අතර, ඒ සඳහා වන පැහැදිලි කිරීම් විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කර ඇත. එම විගණන විමසුම් මඟින් පෙන්වා දී තිබූ ඇතැම් කරුණු සම්බන්ධයෙන් නැවත පැහැදිලි කිරීම් සවිස්තරව විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර ඇත. එකී විමසුම් බොහෝමයකට පාදක වී ඇත්තේ මතභේදයට තුඩු දෙන ගෙවීම් කිසිවක් නොව ඇතැම් චක්‍රලේඛවලට අනුකූල නොවන පරිදි ලේඛන පවත්වාගෙන යෑම හා ඇතැම් රෙගුලාසි වලට සාරානුකූලව ලේඛන පවත්වාගෙන නොයෑම වැනි කරුණු පිළිබඳවය. එකී අඩුපාඩු නිවැරදි කරගැනීමට දැනටමත් කටයුතු කර ඇති බව විගණකාධිපතිවරයා වෙත යවන ලද පැහැදිලි කිරීම්වල පෙන්වා දී ඇත. විගණකාධිපතිවරයාගේ වාර්තාව හා එයට සපයන ලද පිළිතුර මේ සමඟ අමුණා ඇත. කරු. **(ඇමුණුම V)** බලන්න.

ඇමුණුම - I (අ)

**2015-01-08 දින සිට 2015-08-17 දින දක්වා අමාත්‍ය මණ්ඩලකාර්යාලය වෙත යොමු කරන ලද අමාත්‍ය මණ්ඩල සංදේශ සංඛ්‍යාව**

| | අමාත්‍යාංශය | ලැබුණු අමාත්‍ය මණ්ඩල සංදේශ සංඛ්‍යාව |
|---|---|---|
| 1. | අතිගරු ජනාධිපතිතුමා | 24 |
| 2. | අග්‍රාමාත්‍යතුමා | 67 |
| 3. | ආරක්ෂක අමාත්‍යාංශය | 47 |
| 4. | මහවැලි සංවර්ධන සහ පරිසර අමාත්‍යාංශය | 13 |
| 5. | ප්‍රතිපත්ති සම්පාදන, ආර්ථික කටයුතු, ළමා, තරුණ හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය | 55 |
| 6. | මහජන සාමය හා ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍යාංශය | 53 |
| 7. | ස්වදේශ කටයුතු අමාත්‍යාංශය | 27 |
| 8. | ආහාර සුරක්ෂිතතාව අමාත්‍යාංශය | 19 |
| 9. | විදේශ කටයුතු අමාත්‍යාංශය | 27 |
| 10. | රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ප්‍රජාතාන්ත්‍රීය පාලනය පිළිබඳ අමාත්‍යාංශය | 66 |
| 11. | බුද්ධ ශාසන අමාත්‍යාංශය | 9 |
| 12. | වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය | 27 |
| 13. | මුදල් අමාත්‍යාංශය | 103 |
| 14. | නාගරික සංවර්ධන, ජලසම්පාදන හා ජලාපවහන අමාත්‍යාංශය | 61 |
| 15. | විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශය | 51 |
| 16. | සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය | 73 |
| 17. | කෘෂිකර්ම අමාත්‍යාංශය | 30 |
| 18. | මහාමාර්ග, හා ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යාංශය | 33 |
| 19. | ඉඩම් අමාත්‍යාංශය | 16 |
| 20. | නිවාස හා සමෘද්ධි අමාත්‍යාංශය | 33 |
| 21. | අධිකරණ අමාත්‍යාංශය | 31 |
| 22. | ජනමාධ්‍ය අමාත්‍යාංශය | 25 |
| 23. | සංචාරක හා ක්‍රීඩා අමාත්‍යාංශය | 25 |
| 24. | වරාය හා නාවික අමාත්‍යාංශය | 40 |
| 25. | කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය | 33 |
| 26. | වතු යටිතල පහසුකම් සංවර්ධන අමාත්‍යාංශය | 4 |
| 27. | නැවත පදිංචි කිරීම, ප්‍රතිසංස්කරණය හා හින්දු ආගමික කටයුතු අමාත්‍යාංශය | 18 |
| 28. | අධ්‍යාපන අමාත්‍යාංශය | 17 |

| | | |
|---|---|---|
| 29. | විදේශ රැකියා අමාත්‍යාංශය | 8 |
| 30. | අභ්‍යන්තර ප්‍රවාහන අමාත්‍යාංශය | 41 |
| 31. | සමාජ සේවා, සුබසාධන හා පශු සම්පත් සංවර්ධන අමාත්‍යාංශය | 28 |
| 32. | කාන්තා කටයුතු අමාත්‍යාංශය | 5 |
| 33. | මුස්ලිම් ආගමික කටයුතු හා තැපැල් අමාත්‍යාංශය | 15 |
| 34. | ග්‍රාමීය ආර්ථික කටයුතු අමාත්‍යාංශය | 4 |
| 35. | ආපදා කළමනාකරණ අමාත්‍යාංශය | 5 |
| 36. | උසස් අධ්‍යාපන හා පර්යේෂණ අමාත්‍යාංශය | 15 |
| 37. | ගුවන් සේවා අමාත්‍යාංශය | 8 |
| 38. | පළාත් සභා, ප්‍රාදේශීය සංවර්ධන අමාත්‍යාංශය | 10 |
| 39. | විශේෂ ව්‍යාපෘති අමාත්‍යාංශය | 15 |
| 40. | කම්කරු අමාත්‍යාංශය | 15 |
| 41. | නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු අමාත්‍යාංශය | 7 |
| 42. | පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශය | 4 |
| 43. | වාරිමාර්ග අමාත්‍යාංශය | 5 |
| 44. | ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශය | 24 |
| 45. | අමාත්‍ය මණ්ඩලයේ ලේකම් | 5 |
| | **එකතුව** | 1241 |

**ඇමුණුම - I(ආ)**

## 2015-08-17 දිනෙන් පසු 2015-12-31 දක්වා එක් එක් අමාත්‍යාංශ විසින් අමාත්‍ය මණ්ඩල කාර්යාලය වෙත යොමු කරන ලද අමාත්‍ය මණ්ඩල සංදේශ සංඛ්‍යාව

| | අමාත්‍යාංශය | ලැබුණු අමාත්‍ය මණ්ඩල සංදේශ සංඛ්‍යාව |
|---|---|---|
| 1. | අතිගරු ජනාධිපතිතුමා | 21 |
| 2. | අග්‍රාමාත්‍යතුමා | 52 |
| 3. | ආරක්ෂක අමාත්‍යාංශය | 37 |
| 4. | මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය | 16 |
| 5. | ජාතික ඒකාබද්ධතා හා ප්‍රතිසන්ධාන අමාත්‍යාංශය | - |
| 6. | ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය | 36 |
| 7. | සංචාරක සංවර්ධන හා ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍යාංශය | 05 |
| 8. | තිරසර සංවර්ධන හා වනජීවී අමාත්‍යාංශය | 06 |
| 9. | ප්‍රවාහන හා සිවිල් ගුවන්සේවා අමාත්‍යාංශය | 43 |
| 10. | විදේශ කටයුතු අමාත්‍යාංශය | 17 |
| 11. | සමාජ සවිබලගැන්වීම් හා සුබසාධන අමාත්‍යාංශය | 11 |
| 12. | කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යාංශය | 14 |
| 13. | උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යාංශය | 25 |
| 14. | නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යාංශය | 18 |
| 15. | ආපදා කළමනාකරණ අමාත්‍යාංශය | 08 |
| 16. | විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශය | 19 |
| 17. | නීතිය හා සාමය සහ බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය (2015-11-09 දින දක්වා) | 29 |
| 18. | සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය | 25 |
| 19. | මුදල් අමාත්‍යාංශය | 62 |
| 20. | නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු අමාත්‍යාංශය | 06 |
| 21. | ස්වදේශ කටයුතු අමාත්‍යාංශය | 09 |
| 22. | අභ්‍යන්තර කටයුතු, වයඹ සංවර්ධන හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය | 15 |
| 23. | කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය | 16 |
| 24. | මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය | 23 |
| 25. | ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශය | 09 |
| 26. | වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය | 14 |
| 27. | විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යාංශය | 19 |
| 28. | කෘෂිකර්ම අමාත්‍යාංශය | 13 |
| 29. | වාරිමාර්ග හා ජලසම්පත් කළමනාකරණ අමාත්‍යාංශය | 08 |
| 30. | බුද්ධ ශාසන අමාත්‍යාංශය | 02 |
| 31. | අධිකරණ අමාත්‍යාංශය | 23 |
| 32. | ග්‍රාමීය ආර්ථිකය පිළිබඳ අමාත්‍යාංශය | 09 |
| 33. | රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන අමාත්‍යාංශය | 08 |

| | | |
|---|---|---|
| 34. | රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය | 24 |
| 35. | පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ හා ජනමාධ්‍ය අමාත්‍යාංශය | 07 |
| 36. | නිවාස හා ඉදිකිරීම් අමාත්‍යාංශය | 32 |
| 37. | වරාය හා නාවික කටයුතු අමාත්‍යාංශය | 16 |
| 38. | ඉඩම් අමාත්‍යාංශය | 07 |
| 39. | කඳුරට නව ගම්මාන, යටිතල පහසුකම් හා ප්‍රජා සංවර්ධන අමාත්‍යාංශය | 04 |
| 40. | කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශය | 05 |
| 41. | විදේශ රැකියා අමාත්‍යාංශය | 04 |
| 42. | අධ්‍යාපන අමාත්‍යාංශය | 13 |
| 43. | තැපැල්, තැපැල් සේවා හා මුස්ලිම් ආගමික කටයුතු අමාත්‍යාංශය | 07 |
| 44. | පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය | 03 |
| 45. | බන්ධනාගාර ප්‍රතිසංස්කරණ, පුනරුත්ථාපන, නැවත පදිංචි කිරීම හා හින්දු ආගමික කටයුතු අමාත්‍යාංශය | 10 |
| 46. | ඛනිජ තෙල් සම්පත් සංවර්ධන අමාත්‍යාංශය | 12 |
| 47. | ක්‍රීඩා අමාත්‍යාංශය | 09 |
| 48. | නීතිය හා සාමය සහ දක්ෂිණ සංවර්ධන අමාත්‍යාංශය | 04 |
| 49. | විදුලි සංදේශ හා ඩිජිටල් යටිතල පහසුකම් අමාත්‍යාංශය | 02 |
| 50. | ජාතික සහජීවනය, සංවාද හා රාජ්‍ය භාෂා අමාත්‍යාංශය | 03 |
| 51. | ප්‍රාථමික කර්මාන්ත අමාත්‍යාංශය | 03 |
| 52. | සංවර්ධන උපායමාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යාංශය | 04 |
| 53. | විශේෂ කාර්ය භාර අමාත්‍යාංශය | 01 |
| 54. | අමාත්‍ය මණ්ඩලයේ ලේකම් | 09 |
| | **එකතුව** | 797 |

## 2015-01-08 දිනෙන් පසු 2015-08-17 දින දක්වා ක්‍රියා කළ අමාත්‍ය මණ්ඩලයේ සාමාජිකයින්

| | අමාත්‍යවරයා | අමාත්‍ය ධූරය |
|---|---|---|
| 1. | අතිගරු මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා | ජනාධිපති<br>ආරක්ෂක අමාත්‍ය සහ<br>මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍ය |
| 2. | ගරු රනිල් වික්‍රමසිංහ මැතිතුමා | අග්‍රාමාත්‍ය සහ<br>ප්‍රතිපත්ති සම්පාදන, ආර්ථික කටයුතු, ළමා, තරුණ හා සංස්කෘතික කටයුතු අමාත්‍ය |
| 3. | ගරු ජෝන් අමරතුංග මැතිතුමා | මහජන සාමය, ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍ය |
| 4. | ගරු ජෝශප් මයිකල් පෙරේරා මැතිතුමා | ස්වදේශ කටයුතු හා ධීවර අමාත්‍ය |
| 5. | ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මැතිතුමා | ආහාර සුරක්ෂිතතාව අමාත්‍ය |
| 6. | ගරු මංගල සමරවීර මැතිතුමා | විදේශ කටයුතු අමාත්‍ය |
| 7. | එස්.බී.දිසානායක මැතිතුමා | ග්‍රාමීය ආර්ථික කටයුතු අමාත්‍ය<br>**(2015-03-22 දින සිට)** |
| 8. | ගරු ඒ.එච්.එම්.ෆවුසි මැතිතුමා | ආපදා කළමනාකරණ අමාත්‍ය **(2015-03-22 දින සිට)** |
| 9. | ගරු (ආචාර්ය) සරත් අමුණුගම මැතිතුමා | උසස් අධ්‍යාපන හා පර්යේෂණ අමාත්‍ය<br>**(2015-03-22 දින සිට)** |
| 10. | ගරු රෙජිනෝල්ඩ් කුරේ මැතිතුමා | ගුවන් සේවා අමාත්‍ය **(2015-03-22 දින සිට)** |
| 11. | ගරු කරු ජයසූරිය මැතිතුමා | බුද්ධශාසන අමාත්‍ය සහ රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ප්‍රජාතාන්ත්‍රීය පාලනය පිළිබඳ අමාත්‍ය |
| 12. | ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මැතිතුමා | වැවිලි කර්මාන්ත අමාත්‍ය |
| 13. | ගරු රවී කරුණානායක මැතිතුමා | මුදල් අමාත්‍ය |
| 14. | ගරු ජනක බණ්ඩාර තෙන්නකෝන් මැතිතුමා | පළාත් සභා හා ප්‍රාදේශීය සංවර්ධන අමාත්‍ය<br>**(2015-03-22 දින සිට)** |
| 15. | ගරු ෆීලික්ස් පෙරේරා මැතිතුමා | විශේෂ ව්‍යාපෘති අමාත්‍ය **(2015-03-22 දින සිට)** |
| 16. | ගරු එස්.බී.නාවින්න මැතිතුමා | කම්කරු අමාත්‍ය **(2015-03-22 දින සිට)** |
| 17. | ගරු පියසේන ගමගේ මැතිතුමා | නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු අමාත්‍ය<br>**(2015-03-22 දින සිට)** |
| 18. | ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මැතිතුමා | පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ අමාත්‍ය<br>**(2015-03-22 දින සිට)** |
| 19. | ගරු රවුෆ් හකීම් මැතිතුමා | නාගරික සංවර්ධන, ජලසම්පාදන හා ජලාපවහන අමාත්‍ය |
| 20. | ගරු පාඨලී චම්පික රණවක මැතිතුමා | විදුලිබල හා බලශක්ති අමාත්‍ය |
| 21. | ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මැතිතුමා | සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය අමාත්‍ය |
| 22. | ගරු ගාමිණී විජිත් විජයමුණි සොයිසා මැතිතුමා | වාරිමාර්ග අමාත්‍ය **(2015-03-22 දින සිට)** |
| 23. | ගරු දුමින්ද දිසානායක මැතිතුමා | වාරිමාර්ග හා කෘෂිකර්ම අමාත්‍ය |
| 24. | ගරු කබීර් හෂීම් මැතිතුමා | මහාමාර්ග, උසස් අධ්‍යාපන හා ආයෝජන ප්‍රවර්ධන අමාත්‍ය |
| 25. | ගරු එම්.කේ.ඒ.ඩී.එස්.ගුණවර්ධන මැතිතුමා | ඉඩම් අමාත්‍ය |
| 26. | ගරු සජිත් ප්‍රේමදාස මැතිතුමා | නිවාස හා සමෘද්ධි අමාත්‍ය |

| | | |
|---|---|---|
| 27. | ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මැතිතුමා | අධිකරණ අමාත්‍ය |
| 28. | ගරු ගයන්ත කරුණාතිලක මැතිතුමා | ජනමාධ්‍ය හා පාර්ලිමේන්තු කටයුතු අමාත්‍ය |
| 29. | ගරු නවින් දිසානායක මැතිතුමා | සංචාරක හා ක්‍රීඩා අමාත්‍ය |
| 30. | ගරු මහින්ද අමරවීර මැතිතුමා | ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍ය **(2015-03-22 දින සිට)** |
| 31. | ගරු අර්ජුන රණතුංග මැතිතුමා | වරාය හා නාවික අමාත්‍ය |
| 32. | ගරු රිෂාඩ් බදියුදීන් මැතිතුමා | කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍ය |
| 33. | ගරු ප්‍රූ.පලනි දිගම්බරම් මැතිතුමා | වතු යටිතල පහසුකම් සංවර්ධන අමාත්‍ය |
| 34. | ගරු ඩී.එම්.ස්වාමිනාදන් මැතිතුමා | නැවත පදිංචි කිරීම, ප්‍රතිසංස්කරණය හා හින්දු ආගමික කටයුතු අමාත්‍ය |
| 35. | ගරු අකිල විරාජ් කාරියවසම් මැතිතුමා | අධ්‍යාපන අමාත්‍ය |
| 36. | ගරු තලතා අතුකෝරල මැතිතුමිය | විදේශ රැකියා අමාත්‍ය |
| 37. | ගරු ආර්.එම්.රංජිත් මද්දුම බණ්ඩාර මැතිතුමා | අභ්‍යන්තර ප්‍රවාහන අමාත්‍ය |
| 38. | ගරු පී.හැරිසන් මැතිතුමා | සමාජ සේවා, සුබසාධන හා පශු සම්පත් සංවර්ධන අමාත්‍ය |
| 39. | ගරු චන්ද්‍රානි බණ්ඩාර මැතිතුමිය | කාන්තා කටයුතු අමාත්‍ය |
| 40. | ගරු එම්.එච්.ඒ.හලීම් මැතිතුමා | මුස්ලිම් ආගමික කටයුතු හා තැපැල් අමාත්‍ය |

## 2015-08-17 දිනෙන් පසු ක්‍රියා කරන අමාත්‍ය මණ්ඩලයේ සාමාජිකයින් (2015 වසර අවසානය දක්වා)

| | අමාත්‍යවරයා | අමාත්‍ය ධූරය |
|---|---|---|
| 1. | අතිගරු මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා | ජනාධිපති<br>ආරක්ෂක අමාත්‍ය;<br>මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍ය; සහ<br>ජාතික ඒකාබද්ධතා හා ප්‍රතිසන්ධාන අමාත්‍ය |
| 2. | ගරු රනිල් වික්‍රමසිංහ මැතිතුමා | අග්‍රාමාත්‍ය සහ<br>ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍ය |
| 3. | ගරු ජෝන් අමරතුංග මැතිතුමා | සංචාරක සංවර්ධන හා ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍ය |
| 4. | ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මැතිතුමා | තිරසර සංවර්ධන හා වනජීවී අමාත්‍ය |
| 5. | ගරු නිමල් සිරිපාල ද සිල්වා මැතිතුමා | ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍ය |
| 6. | ගරු මංගල සමරවීර මැතිතුමා | විදේශ කටයුතු අමාත්‍ය |
| 7. | ගරු එස්.බී.දිසානායක මැතිතුමා | සමාජ සවිබලගැන්වීම් හා සුබසාධන අමාත්‍ය |
| 8. | ගරු ඩබ්ලිව්.ඩී.ජේ.සෙනෙවිරත්න මැතිතුමා | කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය |
| 9. | ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මැතිතුමා | උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍ය |
| 10. | ගරු (ආචාර්ය) සරත් අමුණුගම මැතිතුමා | විශේෂ කාර්යභාර අමාත්‍ය **(2015-10-23 දින සිට)** |
| 11. | ගරු රවුෆ් හකීම් මැතිතුමා | නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍ය |
| 12. | ගරු අනුර ප්‍රියදර්ශන යාපා මැතිතුමා | ආපදා කළමනාකරණ අමාත්‍ය |
| 13. | ගරු සුසිල් ප්‍රේමජයන්ත මැතිතුමා | විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍ය |
| 14. | ගරු තිලක් මාරපන මැතිතුමා | නීතිය හා සාමය සහ බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍ය **(2015-11-09 දින දක්වා)** |
| 15. | ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මැතිතුමා | සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍ය |
| 16. | ගරු රවි කරුණානායක මැතිතුමා | මුදල් අමාත්‍ය |
| 17. | ගරු මහින්ද සමරසිංහ මැතිතුමා | නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු අමාත්‍ය |
| 18. | ගරු වජිර අබේවර්ධන මැතිතුමා | ස්වදේශ කටයුතු අමාත්‍ය |
| 19. | ගරු එස්.බී.නාවින්න මැතිතුමා | අභ්‍යන්තර කටයුතු, වයඹ සංවර්ධන හා සංස්කෘතික කටයුතු අමාත්‍ය |
| 20. | ගරු රිෂාඩ් බදියුදීන් මැතිතුමා | කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍ය |
| 21. | ගරු පාඨලී චම්පික රණවක මැතිතුමා | මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍ය |
| 22. | ගරු මහින්ද අමරවීර මැතිතුමා | ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍ය |
| 23. | ගරු නවීන් දිසානායක මැතිතුමා | වැවිලි කර්මාන්ත අමාත්‍ය |
| 24. | ගරු රංජිත් සියඹලාපිටිය මැතිතුමා | විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍ය |
| 25. | ගරු දුමින්ද දිසානායක මැතිතුමා | කෘෂිකර්ම අමාත්‍ය |
| 26. | ගරු විජිත් විජයමුණි සොයිසා මැතිතුමා | වාරිමාර්ග හා ජලසම්පත් කළමනාකරණ අමාත්‍ය |
| 27. | ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මැතිතුමා | බුද්ධශාසන අමාත්‍ය; සහ<br>අධිකරණ අමාත්‍ය |
| 28. | ගරු පී.හැරිසන් මැතිතුමා | ග්‍රාමීය ආර්ථිකය පිළිබඳ අමාත්‍ය |
| 29. | ගරු කබීර් හෂීම් මැතිතුමා | රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන අමාත්‍ය |

| | | |
|---|---|---|
| 30. | ගරු රංජිත් මද්දුම බණ්ඩාර මැතිතුමා | රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍ය |
| 31. | ගරු ගයන්ත කරුණාතිලක මැතිතුමා | පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ හා ජනමාධ්‍ය අමාත්‍ය |
| 32. | ගරු සජිත් ප්‍රේමදාස මැතිතුමා | නිවාස හා ඉදිකිරීම් අමාත්‍ය |
| 33. | ගරු අර්ජුන රණතුංග මැතිතුමා | වරාය හා නාවික කටයුතු අමාත්‍ය |
| 34. | ගරු එම්.කේ.ඒ.ඩී.එස්.ගුණවර්ධන මැතිතුමා | ඉඩම් අමාත්‍ය |
| 35. | ගරු යූ. පලනි දිගම්බරම් මැතිතුමා | කඳුරට නව ගම්මාන, යටිතල පහසුකම් හා ප්‍රජා සංවර්ධන අමාත්‍ය |
| 36. | ගරු චන්ද්‍රානි බණ්ඩාර මැතිතුමිය | කාන්තා හා ළමා කටයුතු අමාත්‍ය |
| 37. | ගරු තලතා අතුකෝරල මැතිතුමිය | විදේශ රැකියා අමාත්‍ය |
| 38. | ගරු අකිල විරාජ් කාරියවසම් මැතිතුමා | අධ්‍යාපන අමාත්‍ය |
| 39. | ගරු එම්.එච්.ඒ.හලීම් මැතිතුමා | තැපැල්, තැපැල් සේවා හා මුස්ලිම් ආගමික කටයුතු අමාත්‍ය |
| 40. | ගරු ෆයිසර් මුස්තාපා මැතිතුමා | පළාත් සභා හා පළාත් පාලන අමාත්‍ය |
| 41. | ගරු ඩී.එම්.ස්වාමිනාදන් මැතිතුමා | බන්ධනාගාර ප්‍රතිසංස්කරණ, පුනරුත්ථාපන, නැවත පදිංචි කිරීම හා හින්දු ආගමික කටයුතු අමාත්‍ය |
| 42. | ගරු චන්දිම වීරක්කොඩි මැතිතුමා | ඛනිජ තෙල් සම්පත් සංවර්ධන අමාත්‍ය |
| 43. | ගරු දයාසිරි ජයසේකර මැතිතුමා | ක්‍රීඩා අමාත්‍ය |
| 44. | ගරු සාගල රත්නායක මැතිතුමා | නීතිය හා සාමය සහ දක්ෂිණ සංවර්ධන අමාත්‍ය |
| 45. | ගරු හරීන් ප්‍රනාන්දු මැතිතුමා | විදුලි සංදේශ හා ඩිජිටල් යටිතල පහසුකම් අමාත්‍ය |
| 46. | ගරු මනෝ ගනේෂන් මැතිතුමා | ජාතික සහජීවනය, සංවාද හා රාජ්‍ය භාෂා පිළිබඳ අමාත්‍ය |
| 47. | ගරු දයා ගමගේ මැතිතුමා | ප්‍රාථමික කර්මාන්ත අමාත්‍ය |
| 48. | ගරු මලික් සමරවික්‍රම මැතිතුමා | සංවර්ධන උපායමාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍ය |

# අමාත්‍ය මණ්ඩල කාර්යාලය
# රජයේ නිලධාරින්ට අත්තිකාරම් 'බී' ගිණුම සැසඳුම් ප්‍රකාශය
# 2015 වර්ෂය

රජයේ නිලධාරින්ගේ අත්තිකාරම් ගිණුම - 2015 දෙසැම්බර් 31 වන දිනට සැසඳුම් ප්‍රකාශය

| | වියදමෙහි උපරිම සීමාව<br>රු. ශත | ලැබීම්වල අවම සීමාව<br>රු. ශත | හර ශේෂයේ උපරිම සීමාව<br>රු. ශත |
|---|---|---|---|
| විසර්ජන පනතින් දෙනු ලැබූ සීමාවන් | 2,595,000.00 | 2,395,000.00 | 13,000,000.00 |
| වර්ෂය තුළ ප්‍රතිශෝධිත සීමාවන් | | | |
| නියෝග අංක I | - | - | - |
| නියෝග අංක II | - | - | - |
| වර්ෂය අවසානයේ තත්‍ය අගයන් 005011 | 2,497,046.00 | 2,959,196.82 | 9,055,024.21 |
| 005012 | 1,659,359.50 | 1,114,591.50 | 544,768.00 |
| | **4,156,405.50** | **4,073,788.32** | **9,599,792.21** |
| ජාතික අයවැය චක්‍රලේක 118ට අනුව ගැලපීම | 1,659,359.50 | 1,114,591.50 | |
| (මු.රෙ. 503(1) ප්‍රකාර ගැළපුම් කළ පසු) | **2,497,046.00** | **2,959,196.82** | |
| සීමා නියමයන් පිළිනොපැදීම | - | - | - |

රජයේ නිලධාරීන්ට ණය සහ අත්තිකාරම් පාලන ගිණුම

| | දෙපාර්තමේන්තු පොත් අනුව<br>රු. ශත | භාණ්ඩාගාරයේ පරිගණක වාර්තා අනුව<br>රු. ශත |
|---|---|---|
| වර්ෂය ආරම්භයේ ඉ/ගෙනා ශේෂය 2015-01-01 | 9,517,175.03 | 9,517,175.03 |
| එකතු කළා වර්ෂය තුළ මුළු හර කිරිම් 005011 | 2,497,046.00 | 2,497,046.00 |
| 005012 | 1,659,359.50 | 1,659,359.50 |
| | **4,156,405.50** | **4,156,405.50** |
| අඩු කළා වර්ෂය තුළ මුළු බැර කිරිම් 005011 | 2,959,196.82 | 2,959,196.82 |
| 005012 | 1,114,591.50 | 1,114,591.50 |
| | **4,073,788.32** | **4,073,788.32** |
| වර්ෂය අවසානයේ ශේෂය 2015-12-31 | 9,599,792.21 | 9,599,792.21 |

**ඇමුණුම – IV**

ඩී.ජී.එස්.ඒ - 1

# විසර්ජන ගිණුම 2015

**වියදම් ශීර්ෂ අංකය: 05 අමාත්‍යංශයේ නම : අමාත්‍ය මණ්ඩල කාර්යාලය**

| වාර්ෂික ඇස්තමේන්තුවේ සඳහන් පරිදි වැඩසටහන් අංකය | වාර්ෂික ඇස්තමේන්තුවෙහි සඳහන් පරිදි වැඩසටහනෙහි නම | (1) අයවැය ඇස්තමේන්තු වෙන් කිරීම | (2) පරිපූරක ප්‍රතිපාදන හා පරිපූරක ඇස්තමේන්තු වෙන් කිරීම | (3) මු.රෙ. 66 සහ 69 අනුව මාරු කිරීම | (4) මුළු ශුද්ධ වෙන්කිරීම (1+2+3) | (5) මුළු වියදම | (6) ශුද්ධ ප්‍රතිඵලය ඉතිරිය/ ඉක්මවීම (4-5) | පිටු අංකය (අදාල ඩී.ජී.එස්.ඒ 2 ආකෘතියට අනුව) |
|---|---|---|---|---|---|---|---|---|
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | |
| 1 | **පුනරාවර්තන**<br>මෙහෙයුම් වැඩ සටහන | 67,550,000 | | | 67,550,000 | 62,900,036 | 4,649,964 | 02 |
| | උප එකතුව (පුනරාවර්තන) | 67,550,000 | | | 67,550,000 | 62,900,036 | 4,649,964 | |
| 1 | **මූලධන**<br>මෙහෙයුම් වැඩ සටහන | 9,850,000 | | | 9,850,000 | 2,663,066 | 7,186,934 | 02 |
| | උප එකතුව (මූලධන) | 9,850,000 | | | 9,850,000 | 2,663,066 | 7,186,934 | |
| | **මුළු එකතුව** | **77,400,000** | | | **77,400,000** | **65,563,102** | **11,836,898** | |

පිටු අංක 02 සිට 16 දක්වා ඩී.ජී.එස්.ඒ 2 සිට ඩී.ජී.එස්.ඒ 10 දක්වා වූ ආකෘති පත්‍ර වලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ සටහන් අංක 17 සිට 24 ඇතුලත් අනෙකුත් විස්තර ද මෙම විසර්ජන ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. එබැවින් ඉහත ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාල ගිණුම් තොරතුරු හා සටහන් වලට අනුකූලව පිළියෙල කර ඇති බවත්, භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ අදාල ගිණුම් සැසඳීම් කර ඇති බවත්, ඒවා නිවැරදි බවට තහවුරු වී ඇති බවත් මෙයින් සහතික කරමි.

ප්‍රධාන ගණන්දීමේ නිලධාරී
නම: එස්.අබේසිංහ
තනතුර: අමාත්‍ය මණ්ඩල ලේකම්
දිනය: 2016.03.

එස්. අබේසිංහ
අමාත්‍ය මණ්ඩලයේ ලේකම්.
අමාත්‍ය මණ්ඩල කාර්යාලය.
ජනරජ චතුරශ්‍රය.

ගණන්දීමේ නිලධාරී
නම:
තනතුර:
දිනය:

නම: ඩබ්ලිව්.ඩබ්ලිව්.ඩබ්ලිව්.සී.එස්. ප්‍රනාන්දු
තනතුර: ගණකාධිකාරී
දිනය: 2016.03.30

ඩබ්ලිව්.ඩබ්ලිව්.ඩබ්ලිව්.සී.එස්. ප්‍රනාන්දු
ගණකාධිකාරී
අමාත්‍ය මණ්ඩල කාර්යාලය
ජනරජ චතුරශ්‍රය
කොළඹ 01.

පිටුව 01

17

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
AUDITOR GENERAL'S DEPARTMENT

මගේ අංකය / எனது இல. / My No. } JPA/D/CO/2/15/54 ඔබේ අංකය / உமது இல. / Your No. } දිනය / திகதி / Date } 2016 අප්‍රේල් 25 දින

අධ්‍යක්ෂ ජනරාල්
රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව.

**ශීර්ෂය 05 - අමාත්‍ය මණ්ඩල කාර්යාලයේ 2015 වර්ෂයේ විසර්ජන ගිණුම පිළිබඳව විගණකාධිපති වාර්තාව**

---

ශීර්ෂය 05 - අමාත්‍ය මණ්ඩල කාර්යාලයේ 2015 වර්ෂය සඳහා වූ 2015 දෙසැම්බර් 10 දිනැති අංක 245/2015 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ සඳහන් ඩීජීඑස්ජ් 1 ආකෘතියේ සිට 10 ආකෘතිය දක්වා ආකෘතිද, සටහන (i) සිට සටහන (iv) (අ) හා (ආ) දක්වා වූ තොරතුරු සාරාංශයකින් සමන්විත 2015 වර්ෂය සඳහා වූ විසර්ජන ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148,149,150 හා 152 ව්‍යවස්ථාවන්ට, 2015 අංක 1 දරන හා 2015 අංක 15 දරන විසර්ජන (සංශෝධන) පනත්වලින් සංශෝධිත 2014 අංක 47 දරන විසර්ජන පනත හා වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්ට, 2015 වාර්ෂික අයවැය ඇස්තමේන්තුවට, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ විධිවිධාන ඇතුළත් රාජ්‍ය මුල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පිළියෙල කර ඉදිරිපත් කරන ලද විසර්ජන ගිණුම, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2015 දෙසැම්බර් 10 දිනැති අංක 245/2015 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 150 ප්‍රකාරව රාජ්‍ය ගිණුම් අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් ප්‍රසිද්ධ කළ යුතු විසර්ජන ගිණුම සම්බන්ධයෙන් වූ මාගේ නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

**2. විගණන විෂය පථය**

විසර්ජන ගිණුමේ දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරීවන 2015 අංක 1 දරන හා 2015 අංක 15 දරන විසර්ජන (සංශෝධන) පනත්වලින් සංශෝධිත 2014 අංක 47 දරන විසර්ජන පනතින් පාර්ලිමේන්තුව විසින් නිශ්චය කරන ලද වියදම් සීමාවන් තුළ උපයෝජනයන් සිදු කලේද යන්න හා විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් විසර්ජන ගිණුමේ ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීම පිණිස කාර්යාලයේ විසර්ජන ගිණුම පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් කාර්යාලයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම 2015 දෙසැම්බර් 10 දිනැති අංක 245/2015 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය ප්‍රකාරව විසර්ජන ගිණුමේ සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීමද විගණනයට ඇතුළත් වේ.

**3. විසර්ජන ගිණුම සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 52 ව්‍යවස්ථාව සමඟ කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 124 හා 125 හි දක්වා ඇති කාර්යභාරයන් සම්බන්ධයෙන් වූ රාජ්‍ය මුල්‍ය පරිපාලනයේ ප්‍රමාණවත් බව තහවුරු කිරීම සඳහා ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන් මුදල් අමාත්‍යවරයාට වගකිව යුතු අතර

අංක 306/72, පොල්දුව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව, .- இல. 306/72, பொல்தூவ வீதி, பத்தரமுல்லை, இலங்கை.- No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka
+94-11-2887028-34 +94-11-2887223 oaggov@sltnet.lk www.auditorgeneral.gov.lk

අමාත්‍යාංශයේ හා අමාත්‍යාංශය යටතේ ඇති දෙපාර්තමේන්තුවල මුදල් කටයුතු අධීක්ෂණය කිරීමේ වගකීම භාණ්ඩාගාරයේ විධානයන්ට යටත්ව ප්‍රධාන ගණන්දීමේ නිලධාරින්ට හා ගණන්දීමේ නිලධාරින්ට පැවැරේ. ඒ අනුව විසර්ජන ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148,149,150 හා 152 ව්‍යවස්ථාවන්ට, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්ට, රාජ්‍ය මුල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට හා චක්‍රලේඛ විධිවිධානවලට අනුකූලව පවත්වා ගෙනයාම, පිළියෙල කිරීම හා ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ විසර්ජන ගිණුම පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පවත්වා ගෙන යාම මෙම වගකීමට ඇතුළත් වේ.

## 4. විගණන නිරීක්ෂණ

2015 වර්ෂය සඳහා ශීර්ෂ 05 දරනඅමාත්‍යමණ්ඩල කාර්යාලයේ විසර්ජන ගිණුම පහත දැක්වෙන 4.1 ඡේදයේ සිට 4.7 ඡේදය දක්වා වූ කරුණු දැක්වීම්වලට යටත්ව සතුටුදායක ලෙස පිළියෙල කර ඇති බව නිරීක්ෂණය විය.

4.1 අමාත්‍ය මණ්ඩල කාර්යාලයේ මුළු මූලධන ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 73 ක් ඉතිරි වී තිබුණි.

4.2 වැය විෂයයන් දෙකකට අදාලව එකතුව රු.6,400,000 ක මුළු ශුද්ධ ප්‍රතිපාදනයම ඉතිරි වී තිබුණි.

4.3 වැය විෂයයන් 08 කට අදාලව වෙන් කරන ලද මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.11,630,000 ක් වූ අතර, සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට එම වැය විෂයයන්ට අදාලව මුළු වියදම රු.8,235,992 ක් විය. ඉතිරිවීම් ප්‍රමාණය රු.3,394,008 ක් වූ අතර එය සියයට 12 සිට සියයට 81 දක්වා පරාසයක් තුළ පැවතුණි.

4.4 ඩී.ජී.එස්.ඒ.06 ආකෘතියෙහි 05.01.01.1403 වැය විෂයය යටතේ ඉතිරිය රු.1,613,109 ක් හා ඉතිරියේ ප්‍රතිශතය සියයට 44 ක් ලෙස පෙන්විය යුතු වුවත් ඉතිරිය රු.1,440,241 ක් හා ඉතිරියේ ප්‍රතිශතය සියයට 39 ක් ලෙස පෙන්වා තිබුණි.

4.5 2016 ජනවාරි 19 දිනැති අංක SA/MA/MA/CරCULAR දරන රාජ්‍ය ගිණුම් අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ ලිපිය මගින් සංශෝධිත ආකෘතිය ප්‍රකාරව 2015 විසර්ජන ගිණුමෙහි සටහන (i)මගින් නිරූපනය කළ යුතු ජංගම නොවන වත්කම් සංචලනය පිළිබඳ වාර්තාවේ ආකෘතිය සංශෝධනය කර වාර්තා කර නොතිබුණි.

4.6 2015 විසර්ජන ගිණුමේ මුළු පුනරාවර්තන වියදම සඳහා මූ.රෙ.66 මාරු කිරීම් රු.6,600,000 ක් වූ අතර, එය එම ගිණුමේ ඩී.ජී.එස්.ඒ. 1 හා 2 ආකෘතියේ අංක (3) තීරුවේ හෙළිදරව් කර නොතිබුණි.

4.7 2016 වර්ෂයේදී පොතෙන් කපා හැරීම සඳහා ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අනුමැතිය ලැබී තිබුණු රු.28,546 ක් වූ වාහන අනතුරු 02 ක් 2015 විසර්ජන ගිණුම තුළ පොතෙන් කපා හල අගයක් ලෙස දක්වා තිබුණි.

## 5. පාර්ලිමේන්තුව වෙත වාර්තා කිරීම

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාර මා විසින් ශීර්ෂ 05 ට කාර්යාලයට අදාලව ක්‍රියාකාරිත්වය සම්බන්ධයෙන් වූ විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

සහකාර විගණකාධිපති (ජේපීජ්)
විගණකාධිපති වෙනුවට

පිටපත :- ලේකම්, අමාත්‍ය මණ්ඩල කාර්යාලය